වාර්ෂික වාර්තාව
ஆண்டு நீக்கை
ANNUAL REPORT 2021



උක් පර්යේෂණ ආයතනය
கரும்பு ஆராய்ச்சி நிறுவனம்
SUGARCANE RESEARCH INSTITUTE

වාර්ෂික වාර්තාව - 2021

උක් පර්යේෂණ ආයතනය

ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය

උඩවලව, 70190, ශ්‍රී ලංකාව
දුරකථන +94 472233281 ෆැක්ස් +94 472233233
විද්‍යුත් තැපෑල - info@sugarres.lk
වෙබ් අඩවිය - www.sugarres.lk

කොළඹ කාර්යාලය

අංක 743/25, 4වන පටුමග, මුවන්හෙලවත්ත,
තලංගම උතුර, මාලඹේ
දුරකථන +94 112741602
ෆැක්ස් +94 112741367

සභාපති

දුරකථන +94 112741602
ෆැක්ස් +94 112741367

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

දුරකථන +94 472233282
ෆැක්ස් +94 472233282

පටුන

	පිටු අංකය
දැක්ම	01
මෙහෙවර	01
පාලක මණ්ඩලය	02
උක් පර්යේෂණ ආයතනීය සංවිධාන ව්‍යූහය	04
උක් පර්යේෂණ ආයතනීය අනුමත/තත්‍ය කාර්ය මණ්ඩලය	05
සභාපතිගේ සමාලෝචනය	06
අධ්‍යක්ෂකගේ සමාලෝචනය	08
කාර්යසාධන වාර්තාව	12
අංශික වාර්තා	18
බෝග වැඩිදියුණු කිරීමේ අංශය	20
බෝග හා සම්පත් කළමනාකරණ අංශය	24
බෝග පෝෂණ අංශය	28
බෝග ආරක්ෂණ අංශය	32
යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය	36
සැකසුම් තාක්ෂණ අංශය	40
ආර්ථික විද්‍යා, ජෛවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශය	44
තාක්ෂණ සම්ප්‍රේෂණ සහ සංවර්ධන අංශය	48
ප්‍රකාශන	54
පරිපාලන සහ මුදල් අංශය	56
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව	61
විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	62
විගණකාධිපති වාර්තාව	74
2012 සිට 2021 දක්වා ප්‍රධාන මූල්‍ය තොරතුරු	86

දැක්ම

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්ත තාක්ෂණයන් සම්බන්ධ විශිෂ්ටතම ආයතනය සහ එම කර්මාන්තය දියුණු කිරීමේ ප්‍රමුඛයා වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තයෙහි තරඟකාරීත්වය ඉහළ නැංවීම සහ එය වඩාත් පුළුල්කර විරස්ථායී ලෙස සංවර්ධනය කිරීමට දායකත්වය ලබාදීම සඳහා සුදුසු තාක්ෂණයන් නිපදවීම සහ ප්‍රචාරණය කිරීම

පාලක මණ්ඩලය

ආචාර්ය නිමල් කුමාරසිංහ, සභාපති - උක් පර්යේෂණ ආයතනය



පර්යේෂකයකුවන ආචාර්ය නිමල් කුමාරසිංහ, වසර 35ක් පමණ බෝග පර්යේෂණ ආයතනවල පර්යේෂණ නිලධාරියකු මෙන්ම කළමනාකරුවකු ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ උපදේශකයෙකු සහ සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ උපදේශක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇති අතර, ලංකාවේ විවිධ ජාතික විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු ලෙස වසර 20 ක් පමණ සේවය කර ඇත. මීට අමතරව විවෘත විශ්වවිද්‍යාල පාලක මණ්ඩල සාමාජිකයකු ලෙස හා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කර ඇත. තවද, ඔහු පළිබෝධනාශක තාක්ෂණික උපදේශක කමිටුව සහ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ජාතික විශේෂ සංරක්ෂණ කමිටුව ඇතුළු ජාතික කමිටු ගණනාවකට සිය දායකත්වය දක්වා ඇත. ඔහු රාජකීය කීට විද්‍යා සංගමයේ, ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනයේ, ඇෆ්රෝ ආසියානු නෙමටෝලොජිස්ට් සංගමයේ සහ ජීව විද්‍යා ආයතනයේ සාමාජිකයෙකි. වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) විධායක කමිටුවේ කෘෂිකර්ම අංශයේ නියෝජිත සාමාජිකයෙකු ලෙස සේවය කරන ආචාර්ය නිමල් කුමාරසිංහ, වර්තමානයේ උක් පර්යේෂණ ආයතනයේ පාලක මණ්ඩල සභාපතිවරයා වේ.

මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ජේ. එම්. ද කොස්තා
පත්කළ සාමාජික



මහාචාර්ය ජනේන්ද්‍ර ද කොස්තා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ බෝග විද්‍යාව පිළිබඳ ජ්ෂ්ඨ මහාචාර්යවරයා සහ බෝග විද්‍යා අධ්‍යනාංශයේ අංශ ප්‍රධානී වේ. ඔහු එක්සත් රාජධානියේ රීඩින්ග් (Reading) විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලබා ඇත. ඔහු හට, බෝගවල කායික විද්‍යාව සහ දේශගුණික විපර්යාස ඇතුළු පාරිසරික ආතතියට ඔරොත්තුදීම සම්බන්ධව වසර 30 කට වැඩි පර්යේෂණ සහ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත.

මහාචාර්ය උදය රත්නායක
පත්කළ සාමාජික - 2021.05.04 දක්වා



මහාචාර්ය උදය රත්නායක 2020 වසරේ සිට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස කටයුතු කරන අතර, ඔහු එම විශ්වවිද්‍යාලයේ 7 වැනි උපකුලපතිවරයා වේ. 2001 දී රුහුණු විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය සම්පූර්ණ කර ඇති අතර, 2004 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිය ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත. තවද, ඔහු 2009 දී නායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනය වෙතින් සිය ආචාර්ය උපාධිය සම්පූර්ණකොට ඇත.

ආචාර්ය ඩබ්ලිව්. ජී. සෝමරත්න
පත්කළ සාමාජික - 2021.05.05 සිට



ආචාර්ය ඩබ්ලිව්.ජී. සෝමරත්න 1980 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය ලබා ඇත. ඔහු 1987 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ඉම්පීරියල් විද්‍යාලයෙන් කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ සිය ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර, 1987 දී මෙල්බර්න් හි ලැට්‍රෝබ් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇත. අනතුරුව ඔහු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනයට සම්බන්ධ වී වසර 20ක පමණ කාලයක් එහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙකු ලෙස සේවයකොට ඇත. තවද, පාකිස්තානයේ ඉස්ලාමාබාද්හි SAARC - මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ සාමාජිකයෙකු ලෙස වසර 3ක් සේවය කර ඇති අතර, ඒ මහතා පර්යේෂණ ප්‍රකාශන රාශියක්ම ප්‍රකාශයට පත්කොට ඇත.

සුරේකා එන් අත්තනායක මිය
පත්කළ සාමාජික, වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය
2021.01.31 දක්වා



සුරේකා එන්. අත්තනායක මහත්මිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 19ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ වසර පහක සේවා කාලයක්ද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වසර පහක සේවා කාලයක්ද සම්පූර්ණ කර ඇත. 2015 වසරේ සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරියක ලෙස කටයුතු කරන ඇය 2001 වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේ දී උපාධියද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු නාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද නිමිකරගෙන ඇත. ඊට අමතරව 2011 වසරේ දී ඇය ජර්මනියේ ඩොට්මන්ඩ් නාක්ෂණ විශ්වවිද්‍යාලය සහ පිලිපීන විශ්වවිද්‍යාලය ඒකාබද්ධව ප්‍රධානය කරන ලද සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ විද්‍යාපති උපාධිය නිමිකරගෙන ඇත.

ආර්. සී. වටවල මයා
පත්කළ සාමාජික - වැවිලි රාජ්‍ය අමාත්‍යාංශය - 2021.02.01 සිට



ආර්. සී. වටවල මහතා 2018 වසරේ සිට වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ සංවර්ධන අධ්‍යක්ෂ (සංවර්ධන) ලෙස කටයුතු කරයි. ඔහු 2002 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා 2009 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සහ ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයෙන් පරිසර රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය සම්පූර්ණ කර ඇත. තවද, ඔහු උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ලිවීම සහ සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ඇත. මීට අමතරව, පර්යේෂණ ප්‍රකාශන කිහිපයක්ම ප්‍රකාශයට පත් කිරීමට සමත්ව ඇත.

හිමාලි බෝගොඩගෙදර මිය
පත්කළ සාමාජික - මුදල් අමාත්‍යාංශය




හිමාලි බෝගොඩගෙදර මිය මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙස කටයුතු කරයි. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ඇත. ඊට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යාව) සහ ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත. එමෙන්ම, බෝගොඩගෙදර මහත්මිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් සැලසුම් සහ සංවර්ධන ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ ද සාමාජිකාවකි.

ආචාර්ය එම්. එස්. පෙරේරා
අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි - උක් පර්යේෂණ ආයතනය, නිල බලයෙන් පත්වන සාමාජික
2021.09.01 සිට



ආචාර්ය එම්. එස්. පෙරේරා ආයතනයේ අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී වේ. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය, දර්ශනපති සහ දර්ශන ශූරී යන උපාධි ත්‍රිත්වයම නිමිකරගෙන ඇත. ආචාර්ය එම්.එස්. පෙරේරා 1993 වසරේ පර්යේෂණ නිලධාරියෙකු ලෙස උක් පර්යේෂණ ආයතනයට සම්බන්ධ වූ අතර, ඉන්පසු, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙකු හා ප්‍රධාන පර්යේෂණ නිලධාරීවරයෙකු ලෙස සේවය කර ඇති අතර, 2021 වසරේ සිට උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක තනතුර හොබවයි.

උක් පර්යේෂණ ආයතනයේ සංවිධාන ව්‍යුහය



උක් පර්යේෂණ ආයතනීය අනුමත කාර්ය මණ්ඩලය - 2021

තනතුර	වැටුප් කේතය	සේවා ගණය	අනුමත කාර්ය මණ්ඩලය	පවතින කාර්ය මණ්ඩලය
			ස්ථිර	ස්ථිර
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී	එච්. එම්. 2 - 3	ජ්‍යෙෂ්ඨ	1	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	එච්. එම්. 1 - 3	ජ්‍යෙෂ්ඨ	1	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප. තා. හූ.)	එච්. එම්. 1 - 3	ජ්‍යෙෂ්ඨ	1	0
ප්‍රධාන තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී	එච්. එම්. 1 - 3	ජ්‍යෙෂ්ඨ	1	0
ප්‍රධාන පර්යේෂණ නිලධාරී	එච්. එම්. 1 - 3	ජ්‍යෙෂ්ඨ	5	0
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	ඒ. ආර්. 2	ජ්‍යෙෂ්ඨ	1	0
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	ඒ. ආර්. 2	ජ්‍යෙෂ්ඨ	4	4
තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී	ඒ. ආර්. 1	ජ්‍යෙෂ්ඨ	1	1
පර්යේෂණ නිලධාරී	ඒ. ආර්. 1	ජ්‍යෙෂ්ඨ	16	15
අභ්‍යන්තර විගණක	එම්. එම්. 1 - 2	ජ්‍යෙෂ්ඨ	1	1
ගණකාධිකාරී	එම්. එම්. 1 - 2	ජ්‍යෙෂ්ඨ	1	1
සහකාර අධ්‍යක්ෂ (පාලන)	එම්. එම්. 1 - 2	ජ්‍යෙෂ්ඨ	1	1
සංවර්ධන නිලධාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	5	5
වැඩ අධිකාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	1	1
ශිෂ්‍යම් නිලධාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	1	1
පරිපාලන නිලධාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	1	1
ප්‍රසම්පාදන නිලධාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	1	1
ගොවිපළ අධිකාරී	ජේ. එම්. 1 - 2	තෘතීයික	1	1
භාෂා ප්‍රුල්ඛක	එම්. ඒ. 4	තෘතීයික	1	0
පොත් තබන්නා	එම්. ඒ. 2 - 2	ද්විතීයික	1	0
ගබඩා භාරකරු	එම්. ඒ. 2 - 2	ද්විතීයික	1	1
තාක්ෂණ නිලධාරී	එම්. ඒ. 2 - 2	ද්විතීයික	20	19
වැඩ පරීක්ෂක	එම්. ඒ. 2 - 2	ද්විතීයික		1
කළමණාකර සහකාර (යතුරු ලියන්නා, යතුරු ලියන්නා/ලිපිකරු, ශිෂ්‍යම් ලිපිකරු, පුද්ගලික සහකාර)	එම්. ඒ. 1 - 2	ද්විතීයික	18	11
දූරකථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී	එම්. ඒ. 1 - 2	ද්විතීයික	1	1
වැඩ පරිපාලක	එම්. ඒ. 1 - 2	ද්විතීයික	-	1
කාර්මික	ජී. එල්. 3	ප්‍රාථමික	1	1
විදුලි කාර්මික	ජී. එල්. 3	ප්‍රාථමික	2	1
වෑල්ඩ්කරු	ජී. එල්. 3	ප්‍රාථමික	1	1
වැල්ඩින්කරු	ජී. එල්. 3	ප්‍රාථමික	1	1
වඩු කාර්මික	ජී. එල්. 3	ප්‍රාථමික	2	2
පෙදරේරු/ජල නළ කාර්මික	ජී. එල්. 3	ප්‍රාථමික	1	0
කම්මල්කරු	ජී. එල්. 3	ප්‍රාථමික	1	1
ට්‍රැක්ටර් රියදුරු	ජී. එල්. 3	ප්‍රාථමික	2	3
රියදුරු	ජී. එල්. 3	ප්‍රාථමික	12	8
සංචාරක බංගලා භාරකරු	ජී. එල්. 2	ප්‍රාථමික	1	1
රසායනාගාර/ක්ෂේත්‍ර උපස්ථායක	ජී. එල්. 2	ප්‍රාථමික	9	9
ජල පොම්ප ක්‍රියාකරු	ජී. එල්. 2	ප්‍රාථමික	3	3
පොදු කම්කරු	ජී. එල්. 1	ප්‍රාථමික	70	58
රිය සහායක	ජී. එල්. 1	ප්‍රාථමික	1	1
කම්කරු*	ජී. එල්. 1	ප්‍රාථමික	-	34
Total			**193**	**193**

*තනතුර දරන්නාට පෞද්ගලිකවන සේ 2104 අයවැය යෝජනා අනුව ස්ථිරකර ඇත.

සභාපතිගේ සමාලෝචනය



උක් පර්යේෂණ ආයතනය සඳහා ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 365.00ක්, 2021 වර්ෂය වෙනුවෙන් විධිමත්ලෙස වෙන්කොට ඇත. මෙම ප්‍රතිපාදනවලින් මුළු රු. මිලියන 285 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර, ඉතිරි රුපියල් මිලියන 80 ප්‍රාග්ධන වියදම් සඳහා වේ. කෙසේ වෙතත්, ආයතනයට 2021 දී භාණ්ඩාගාරයෙන් ලැබුණේ රුපියල් මිලියන 325.75ක් පමණි. එනම්, රු. මිලියන 55.8ක් ප්‍රාග්ධන වියදම් ලෙස ද, රු. මිලියන 269.95ක් පුනරාවර්තන වියදම් ලෙස ද වේ. එනම්, පුනරාවර්තන වියදම් සඳහා 94.7% අරමුදල් ලැබුණ ද, ප්‍රාග්ධන හා ඉදිකිරීම් සඳහා වෙන් කළ මුදලින් ලැබුණේ 69.75%ක් පමණි.

වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහයක් පවත්වන ලදී. විදේශීය ප්‍රභේද වාණිජ වගාවන් සඳහා හඳුන්වාදීම, ග්‍රාමීය උක් හකුරු කර්මාන්තය පුනර්ජීවනය කිරීම තුළින් සීනි ආදේශක නිෂ්පාදනය වැඩිදියුණු කිරීම, උක් වගාව කාබනික ගොවිතැන් ක්‍රමවලට පරිවර්තනය කිරීම, පර්යේෂණ සඳහා ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම වැනි වැදගත් ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇත. මීට අමතරව, බාහිර අරමුදල් ප්‍රභවයන් සහිත වැඩසටහන්, කාර්යමණ්ඩල පුහුණු ප්‍රතිපත්තිය සහ පර්යේෂණ සහ තාක්ෂණ හුවමාරුව පිළිබඳ උපදේශන කමිටුවක් පිහිටුවීම වැනි කාර්යයන් සිදු කරන ලදී.

ආයතනයේ විධානයට අනුව, සමාලෝචනය කරන ලද කාර්යසාධනය පහත පරිදි වේ.

ආයතනය විසින් සංවර්ධනය කරන ලද උක් ප්‍රභේද හෙක්ටයාර 22,694ක් එනම්, සමස්ත උක් වගාකරන ප්‍රදේශවලින් 86%ක් දක්වා ව්‍යාප්ත වී ඇත. දේශීය වාණිජ වගාවන් සඳහා ඉහළ සීනි අන්තර්ගතයක් සහිත ආනයනික උක් ප්‍රභේද උක් ප්‍රභේද 29 ක් (වියට්නාමයෙන් වර්ග 20 ක් සහ චීනයෙන් වර්ග 9 ක්) උක් ජානප්ලාස්මයට ඇතුළත් කිරීම සහ තේරීම් වැඩසටහන් සඳහා චීනයෙන් ආනයනය කරන ලද මූලම් 25 කින් නිෂ්පාදනය කරන ලද බීජ පැළ ඇතුළත් කිරීම වර්ෂය තුළ ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල සැලකිය යුතු ජයග්‍රහණ අතර වේ. වාණිජ වගාව සඳහා ලබා දීමට පෙර, 2002 ශ්‍රේණියේ ප්‍රමුඛ ප්‍රභේද 27ක් සහ 2003 ශ්‍රේණියේ ප්‍රමුඛ ප්‍රභේද 27ක් මහා පරිමාණ ඇගයීම සඳහා පැල්වත්ත, ගල්ඔය, සෙවනගල සහ ඇනිමලේ ප්‍රදේශවල ගුණනය කරන ලදී. ඇනිමලේ, සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය යන ප්‍රදේශයන්හි නිරීක්ෂණ ක්ෂේත්‍ර පිහිටුවීමෙන්, විදේශීය ප්‍රභේද ඇගයීමට ලක් කරන ලදී.

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පර්යේෂණ තුනක් සිදු කරන ලදී;

අ. උක් වගාව සහ අස්වැන්න මත පිෂ්ඨය පදනම් වූ සුපිරි අවශෝෂක (ZEBA) බලපෑම

ආ. ප්‍රතිස්ථාපන පොහොරක් ලෙස **යාරා** පිළිගත හැකි බව තක්සේරු කිරීම සහ

ඇ. කැටිති කෘමිනාශකයක් වන Chlorantraniliprole 0.4% ක්‍රියාකාරිත්වය

2021 වර්ෂය තුළ කර්මාන්ත සඳහා සැපයූ සේවාවන් පහත පරිදි වේ.

1. ලංකා සීනි සමාගම (පැල්වත්ත) හි උණු දිය ප්‍රතිකාර ඒකකයේ විදුලි, ජල සංසරණ සහ තාපන පද්ධති වැඩිදියුණු කිරීම.
2. ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගමෙහි නව ස්වයංක්‍රීය උණු දිය ප්‍රතිකාර ඒකකය ස්ථාපනය කිරීම අධීක්ෂණය කිරීම.
3. කොම්පෝස්ට් සකස් කිරීම සඳහා පාංශු ක්ෂුද්‍රජීවී එන්නතක් හඳුන්වා දීම සහ පෙරහන්-මඩ සහ විනෑස්වලින් කොම්පෝස්ට් සෑදීම සඳහා ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයට තාක්ෂණික සහාය ලබා දීම.

උක් වගාවේ වල් පැළෑටි පාලනයට පූර්ව අවධියේ දී ඵලදායී වන Saflufenacil 68 g/L + Dimethanamide P 600 g/L EC නව වල් නාශකයක් හඳුනා ගැනීම මෙන්ම, වගාවන්හි පළිබෝධ සහ රෝග තත්ත්වයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීම ඇතුළුව බෝග ආරක්ෂණ පර්යේෂණ වසර පුරා සිදු කරන ලදී.

එස්. එල්. 96 128 ප්‍රභේදයේ උක්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ක්ෂුද්‍ර පෝෂකයක් වන සින්ක්වල හිතකර බලපෑමක් සොයා ගැනීම සහ පොහොර සහ ජෛව රසායනික සහ ජෛව පාලනය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ට අනුකූලව, කාබනික ගොවිතැන හඳුන්වා දීමෙන් කාබනික උක් වගාවක් බවට පත් කිරීමේ වැඩසටහනක් නිර්මාණය කිරීම පොහොර සම්බන්ධ පර්යේෂණවලට ඇතුළත් විය.
මෙම වසරේ තවත් කැපී පෙනෙන ජයග්‍රහණයක් වූයේ ආයතනය විසින් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කැටිති යෙදීම සඳහා පොහොර යෙදීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම සහ අන්තර් ජෙළි පොහොර යෙදීම සඳහා නව රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකර හැකි පොහොර කැටිති යොදනය ඇගයීමයි. කිලිනොච්චියේ ආනවිල්ලුන්දන් සැකසුම් මධ්‍යස්ථානය සඳහා සහාය ලබා දීමෙන් උතුරේ ගොවි ප්‍රජාවන්ට හකුරු සහ සිරප් නිෂ්පාදනය කිරීමට ආයතනය සහයවන ලදී. ආයතනය විසින් ආනවිල්ලුන්දන් උක් වගාකරුවන්ගේ සංවිධානයට ලබා දුන් තාක්ෂණික උපදෙස්වල ප්‍රතිඵලයක් ලෙස ආනවිල්ලුන්දන් සැකසුම් කම්හල කිලිනොච්චි වෙළෙඳපොළ සඳහා හකුරු සහ සිරප් හඳුන්වා දෙන ලදී. කිලිනොච්චියේ ස්කන්ධපුරම් ප්‍රදේශය දක්වා උක් වගාව ව්‍යාප්ත කිරීම, උක් වගාව සම්බන්ධයෙන් ස්කන්ධපුරම් ප්‍රදේශයේ ගොවීන්ට තාක්ෂණික සහාය ලබා දීම සහ ගොවීන්ට බීජ උක් සැපයීම සඳහා වන්නෙරිකුලම් බීජ උක් තවාන පවත්වාගෙන යාම තවත් වැදගත් කාර්යයන් කිහිපයකි. රාජ්‍ය අමාත්‍යාංශයේ මග පෙන්වීමෙන්, නාගොඩ - ගාල්ල, වැලිඔය - මුලතිව්, සහ රුවන්වැල්ල - කෑගල්ල වැනි දිවයිනේ සාම්ප්‍රදායිකව උක් වගා නොකරන ප්‍රදේශවල "උක් වගා ගම්මාන" පිහිටුවීමට මූලික කටයුතු සූදානම් කරන ලදී.

උක් පර්යේෂණ ආයතනයේ යාවත්කාලීන කරන ලද කාබනික උක් වගා පර්යේෂණ වැඩසටහනට අනුකූලව කාබනික උක් වගාව සම්බන්ධ නිරීක්ෂණ ක්ෂේත්‍ර 3ක්, ආයොතනයේ පර්යේෂණ ගොවිපොළ, ගල්ඔය සහ ඇතිමලේ සීනි කර්මාන්තාශ්‍රිතව ස්ථාපිත කිරීම, විද්‍යාඥයින්, ව්‍යාජ්ති නිලධාරීන් සහ ගොවීන් අතර ව්‍යාජ්ති පණිවිඩ හුවමාරු කර ගැනීම සඳහා SRI - TTD e-SMS සේවාව පවත්වාගෙන යාම සහ ආයතනයේ Facebook පිටුව සහ වෙබ් අඩවිය පවත්වාගෙන යාම ද වසර තුළ සිදුකළ අනෙකුත් සේවාවන් අතර වේ. මීට අමතරව, තාක්ෂණය බෙදා හැරීම සඳහා, උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුනෙහි වෙළුම් තුනක් ප්‍රකාශයට පත්කරන ලදී.

බදුල්ල, කිලිනොච්චි සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල කුඩා පරිමාණ උක් හකුරු සහ පැණි කර්මාන්තවල ගොවීන් සඳහා තවාන් පිහිටුවීම සහ පුහුණු කිරීම් අඛණ්ඩව සිදු කරන ලදී. පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 22ක් ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ තාක්ෂණ හුවමාරු වැඩසටහනේ කොටසක් ලෙස ගොවීන් 195 දෙනෙකු සහ ක්ෂේත්‍ර නිලධාරීන් 135 දෙනෙකුට නව උක් තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. වර්ෂය තුළ දී, සීනි කර්මාන්තශාලා ආශ්‍රිතව ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාන 87ක් ස්ථාපිත කර නඩත්තු කරන ලද අතර, උක් වගාවේ විවිධ අංශ පිළිබඳ උපදෙස් පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා බෙදා හැරීම සිදු කරන ලදී.

උක් ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය සකස් කිරීම, වැලිඔය (1,500 TCD), හොරොව්පතාන (5,000 TCD), සහ බිබිල (TCD 4,000 TCD) නව උක් කර්මාන්තශාලා සඳහා යෝජනා ඇගයීම සහ රාජ්‍ය අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කිරීම සීනි අංශයේ සංවර්ධනයට අදාළව කරන ලද අනෙකුත් මූලපිරීම් අතර විය. වියට්නාමයේ ශාක ආරක්ෂණ පර්යේෂණ ආයතනය (PPRI) සහ චීනයේ යුනාන් කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය වැනි විදේශීය සංවිධාන සමඟ පර්යේෂණ සහයෝගිතා පවත්වා ගෙන යන ලදී

උඩවලව ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානයේත්, දෙනියාය සහ කන්තලේ උප මධ්‍යස්ථානවලත් පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී. කොම්පෝස්ට් සහ පොහොර කැටිති මෙන්ම මෘදුකාංග නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සහ උපකරණ පර්යේෂණ අංශ වෙත ලබා දී නව තාක්ෂණයන් දියුණු කිරීමේ හැකියාව වැඩි කරන ලදී. වසර තුළ, ආයතනයේ නිල නිවාසවල, සංචාරක බංගලාව සහ ශ්‍රවණාගාරයේ යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලදී.

ආයතනයේ සේවක සංඛ්‍යාව එහි මෙහෙවර ඉටු කිරීම සඳහා සුදුසුකම්ලත් සේවක සංඛ්‍යාවකට පහසුකම් සැලසීම සඳහා සංශෝධනය කරන ලදී. අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන පුහුණුවීම් තුනක් සහ දිගු කාලීන පුහුණුවීම් හයක් ලබා දුනි. මීට අමතරව පර්යේෂණ නිලධාරීන් හතර දෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් පවත්වාගෙන ගිය අතර, එක් පර්යේෂණ නිලධාරියෙකු ආචාර්ය උපාධියක් හැදෑරීමට නිදහස් කරන ලදී. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සහ ගණකාධිකාරී වෙත ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි පුහුණුව ලබා ගැනීමට අවස්ථා ලබාදෙන ලදී.

උක් පර්යේෂණ ආයතන පනත සහ ක්‍රියා පටිපාටි අත්පොත සංශෝධනය කරමින් පවතින අතර, ආයතනයේ බඳවා ගැනීමේ ක්‍රමය සංශෝධනයකොට, අනුමැතිය සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

කෝවිඩ් වසංගත තත්වය හමුවේ රට අගුලු දැමීමේ දී පවා, උඩවලව ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය, දෙනියාය අභිජනන මධ්‍යස්ථානය, හන්තාන නිරෝධායන මධ්‍යස්ථානය, සියඹලාණ්ඩුව ව්‍යාධි විද්‍යා ගොවිපොළ යන සියල්ලම බාධාවකින් තොරව නියමිත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියැලෙමින් කාලසටහනට අනුව ක්‍රියාත්මක විය. විශේෂයෙන් විද්‍යාත්මක හා ඉහළ කළමනාකරණ තනතුරු සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිකම සහ වත්මන් තත්ත්වය තුළ බඳවා ගැනීමේ නීතිවලට අනුකූලව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දුෂ්කරතා ආයතනයේ ක්‍රියාකාරීත්වයට ප්‍රධාන බාධාවක් විය.

ආචාර්ය. නිමල් කුමාරසිංහ
සභාපති

අධ්‍යක්ෂගේ සමාලෝචනය



උක් පර්යේෂණායතනය 2021 වර්ෂයේ දී සිය කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යමින්, උක් සම්බන්ධ නව දැනුම/තාක්ෂණය උත්පාදනය කිරීම, සීනි සමාගම්, ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් වෙත තාක්ෂණික දැනුම බෙදා හැරීම, පදනම් බීජ සැපයීම, සහ කුඩා පරිමාණ සැකසුම් කර්මාන්ත දිරි ගැන්වීම මගින් උක් වගාව පුළුල් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය දියුණු කිරීමට දායක විය. උක් වගාව වැඩිදියුණු කිරීම, බෝග සහ සම්පත් කළමනාකරණය, බෝග පෝෂණය, බෝග ආරක්ෂණය, ගොවිපොළ යාන්ත්‍රිකකරණය සහ සැකසුම් සහ නිෂ්පාදන සංවර්ධනය යන අංගයන්ගෙන් සමන්විත දිගුකාලීන පර්යේෂණ වැඩසටහනක් උක් වගාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක විය. පර්යේෂණ වැඩසටහන මගින් ජනනය කරන ලද දැනුම/තාක්ෂණයන් සීනි සමාගම්, ගොවීන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් වෙත බෙදා හැරීම සඳහා තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ආයතනය විසින් නිර්දේශ කරන ලද නව උක් ප්‍රභේදවල අත්තිවාරම් බීජ නිෂ්පාදනයෙන් සමන්විත සංවර්ධන වැඩසටහන ද අඛණ්ඩව සිදු කරන ලදී.

2002 වසරෙන් පසු අභිජනනය කරන ලද ශ්‍රේණි වල, බොහෝ විශිෂ්ට ලක්ෂණ සහිත උක් ප්‍රභේද ඇති අතර, ඒවා තෝරාගැනීමේ විවිධ අදියරවල පවතී. 2010/2011 ශ්‍රේණි වලින් 58ක්, එස්. එල්. 2009 ශ්‍රේණියෙන් ප්‍රභේද 22ක්, එස්. එල්. SL 2008 ශ්‍රේණියෙන් ප්‍රභේද 22ක්, SL 2007 ශ්‍රේණියෙන් ප්‍රභේද 24ක් හා 2006 ශ්‍රේණියෙන් ප්‍රභේද 23ක්, ඉහළ උක් සහ සීනි අස්වැන්න සහ රෝග සහ පළිබෝධවලට හොඳින් ඔරොත්තුදෙන ප්‍රභේද ලෙස හඳුනාගෙන ඇති අතර, ඒවා විශාල මෝල් පරීක්ෂාවට පෙර අවසන් ක්ෂේත්‍ර ඇගයීම් සිදු කරන ලදී. 2002 ශ්‍රේණියෙන් ප්‍රභේද 28ක් සහ 2003 ශ්‍රේණියෙන් ප්‍රභේද 27ක් මහා පරිමාණ ඇගයීම් සඳහා, ලංකා සීනි සමාගම (පැල්වත්ත සහ සෙවනගල), ඇනිමලේ වැවිලි සමාගම සහ ගල්ඔය වැවිලි සමාගම්වල ක්ෂේත්‍රයන්හි ගුණනය කිරීමට භාජනය කරන ලදී. වාණිජ වගාව සඳහා නිකුත් කිරීමට පෙර, ආනයනික උක් වර්ග 29ක් (වියට්නාමයෙන් ආනයනය කරන ලද ප්‍රභේද 20ක් සහ චීනයෙන් ප්‍රභේද 9ක්) සහ තෝරා ගැනීමේ වැඩසටහන සඳහා චීනයෙන් ආනයනය කරන ලද මුහුම් 25 කින් නිපදවන ලද බීජ පැළ උක් ජාන ප්ලාස්මයට ඇතුළත් කරන ලදී. විදේශීය උක් ප්‍රභේද ඇගයීමේ ක්ෂේත්‍ර, ලංකා සීනි සමාගම (පැල්වත්ත සහ සෙවනගල), ඇනිමලේ වැවිලි සමාගම සහ ගල්ඔය වැවිලි සමාගම්වල ක්ෂේත්‍රයන්හි ස්ථාපිතකොට පවත්වාගෙන යාම සිදුකරන ලදී. 2021 මුහුම් වාරය තුළ මුහුම් 1,025ක් සිදු කළ අතර, මෙම මුහුම් සීනි සහ උක් අස්වැන්න වැඩි දියුණු කිරීම සහ රෝග (කලු ටුඹුලු රෝගය, පත්‍ර ප්‍රදාහය සහ සුදු පත්‍ර රෝගය) ප්‍රතිරෝධය සඳහා දිඟානුගත වන අතර, මේවායේ සත්‍ය බීජ සැකසීම සිදු වෙමින් පවතී. දෙනියාය, එන්සල්වත්තේ උක් අභිජනන මධ්‍යස්ථානයේ කලින් ස්ථාපිත උක් දර්ශ 1,659ක් සහ උඩවලවේ උක් පර්යේෂණායතනයේ වාණිජ හා ආසන්න වාණිජ ප්‍රභේද 45කින් අභිජනනය කරන්නාගේ බීජ උද්‍යානය පවත්වාගෙන යාම සිදු කරන ලදී.

බෝග සහ සම්පත් කළමනාකරණය යටතේ Saflufenacil 68 g/L + Dimethanamide P 600 g/L EC උක් වගාවෙහි පෙර මතුවන අදියරේදී වල් පැළෑටි මර්දනයට ඵලදායී නව වල් නාශකයක් ලෙස හඳුනාගෙන ඇත. 2003 ශ්‍රේණියේ ප්‍රභේදවල එනම් එස්. එල්. 03 336, එස්. එල්. 03 341, එස්. එල්. 03 425, එස්. එල්. 03 442, එස්. එල්.03 762, එස්. එල්. 03 983, එස්. එල්. 03 1025, එස්. එල්.03 1077, එස්. එල්. 03 1134, එස්. එල් 03 5428, එස්. එල් 03 5441 සහ එස්. එල්. 03 5445 වසර තුළ දී මේරීමේ රටාව තීරණය කිරීම කරන ලදී. මහ කන්නයේ වගා කරන විට Co 775 ට සාපේක්ෂව එස්. එල් 03 5428, එස්. එල් 03 5441, සහ එස්. එල්. 03 5445 යන උක් ප්‍රභේද ඉහළ මල් පිපීමේ ප්‍රතිශතයක් සහිත උක් වර්ග ලෙස හඳුනාගෙන ඇත. වර්ෂාපතන තත්වයන් යටතේ වල්නාශක යෙදීම හා අතින් වල් නෙලීම හා සසඳන විට පොලිනින් වසුන් යෙදීමේ දී ද සමාන උක් අස්වැන්නක් ලබා දෙන බව හඳුනාගත් අතර, වසුන් යෙදීම තුළින් පඳුරු දැමීම වැඩි කරන බව හඳුනාගෙන ඇත. පුරන් උක් වගාවට සුදුසු හරිත පොහොර බෝග ලෙස සන්හෙම්ප් සහ මුං හඳුන්වා දෙන ලදී. කිලිනොච්චියේ උක් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චිය දේශීය වෙළෙඳපොළ සඳහා ආනවිලුන්තාන් සැකසුම් ඒකකය මගින් නිෂ්පාදනය කරන ලද හකුරු සහ සිරප් හඳුන්වා දෙන ලදී. තවද, කිලිනොච්චියේ ඝකන්ධපුරම් ප්‍රදේශයට උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා බීජ උක් සැපයීමට වන්නෙරිකුලම් බීජ තවාන නඩත්තු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

බෝග පෝෂණ වැඩසටහන යටතේ සිදු කරන ලද පර්යේෂණ මගින් පාංශු සාරවත් කළමනාකරණය පිළිබඳ නිර්දේශ සපයනු ලැබේ. පසෙහි පොස්පරස් සහ පොටැසියම් සාන්ද්‍රණය මත පදනම්ව පාංශු කාණ්ඩ හතරක් යටතේ උක් වගාකරන පස් සඳහා ප්‍රදේශ විශේෂිත පොහොර නිර්දේශ ආකෘතියක් සකස් කරන ලදී. තවද, සෙවනගල උක් වගාකරන පස් සඳහා පොටැසියම් ස්වාරක්ෂක ධාරිතාව මත වර්ගීකරණ ක්‍රමවේදයක් සැකසීම අවසන් කරන ලද අතර, සෙවනගල ප්‍රදේශයේ පසෙහි පොස්පරස් සාන්ද්‍රණ සම්බන්ධතාවයට අවශෝෂණය වීමේ රටාව සහ පාංශු ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය (එනම් Fe, Mn, Zn සහ Cu) හඳුනා ගන්නා ලදී. විවිධ වර්ගයේ කාබනික-ඛනිජ පොහොර පෙති නිෂ්පාදනය කිරීම සහ ඒවායේ කාර්යසාධනය ඇගයීම සඳහා රසායනාගාර තත්ත්ව ඇගයීම සහ පර්යේෂණ ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම සිදු කරන ලදී. උක් වගාව සඳහා සංයුක්ත පොහොරවල යෝග්‍යතාවය හඳුනා ගැනීම සඳහා වර්ෂා පෝෂිත සහ වාරි තත්ත්ව යටතේ ස්ථාපිත ක්ෂේත්‍ර පර්යේෂණයේ පළමු නිරි බෝගය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. SL 96 128 ප්‍රභේදයේ උක්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පාංශු ක්ෂුද්‍ර පෝෂකයක්වන සින්ක් හි ධනාත්මක බලපෑමක් හඳුනා ගන්නා ලදී. තවද, උක් වගාව සඳහා යූරියා සහ ඇමෝනියම් සල්ෆේට්

පොහොරවල බලපෑම හඳුනා ගැනීම සඳහා සෙවනගල ප්‍රදේශයේ ස්ථාපිත ක්ෂේත්‍ර අබණ්ඩව පවත්වාගෙන යන ලද අතර, සෙවනගල කොම්පෝස්ට් සකස් කිරීම සඳහා ක්ෂුද්‍රජීවී ආමුකුලකයක් හඳුන්වාදෙන ලදී.

උක් බෝග ආරක්ෂණය යටතේ සුදු පත්‍ර රෝගය සහ උක් කඳන් විදින පණුවා මර්දනය සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙන ලදී. වාණිජ උක් වගාවන්හි රෝග සහ පළිබෝධ තත්ත්වයන් පිළිබඳව නිරන්තර නිරීක්ෂණ ලබා ගන්නා ලද අතර, රෝග සහ පළිබෝධකයන් පැතිරීම වැළැක්වීම සඳහා කාලෝචිත පියවර ගැනීමට හැකිවන පරිදි පවතින තත්ත්වයන් පිළිබඳව සීනි සමාගම්වල අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. තවද, උක් රෝග සහ පළිබෝධ කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා ගොවීන් සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සඳහා නිරන්තර දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. සුදු පත්‍ර රෝග පාලනය සඳහා ඒකාබද්ධ වාහක කළමනාකරණයට, උක් සමග අතුරු බෝගයක් ලෙස අබ ශාකය වගා කිරීම සහ උක් පේළි දෙකක් අතර පරතය වැඩි කිරීම ලෙස නව උපායමාර්ග දෙකක් ඇතුළත්කරන ලදී. Euborellia spp (Earwig) සහ Micarspis discolor (Ladybird Beetle) විලෝපිකයන් දෙදෙනෙකු රසායනාගාර තුළ සාර්ථකව ඇති කිරීම සඳහා ප්‍රොටෝකෝල සංවර්ධනය කරන ලදී. Chlorantraniliprole 0.4% (w/w) උක් සලබයන් මර්දනය සඳහා ඵලදායී රසායනයක් ලෙස හඳුනා ගන්නා ලදී. ප්‍රධාන උක් රෝගවල ප්‍රාථමික සම්ප්‍රේෂණය පාලනය කිරීම සඳහා වඩාත් ඵලදායී බීජ-උක් ප්‍රතිකාරය හඳුනා ගන්නා ලදී. පැය 36 සහ 48 කාලයක් සීතල ගලායන ජලයේ පොහවා, සෙල්සියස් අංශක 54 උෂ්ණත්වයේ විනාඩි 50ක උණු දිය ප්‍රතිකාර කිරීම මගින් පත්‍ර ප්‍රදාහ රෝගය, සුදු පත්‍ර රෝග සැළකිය යුතු ලෙස අඩුකරන අතර පැළවීමේ ප්‍රතිශතය සහ අස්වැන්නෙහි වැඩිවීමක් වාර්තා කරයි. උක් ප්‍රභේද තේරීමේ ක්‍රියාවලියේ දී, කලු දුඹුළු රෝගය සඳහා ප්‍රතිරෝධිතාවය කල් තියා හඳුනා ගැනීමේ වක්‍ර නිර්ණායක ලෙස, ජෛව රසායනික දර්ශක, එනම් පත්‍රවල ඇති සම්පූර්ණ ෆිනෝලික් අන්තර්ගතය, රූප විද්‍යාත්මක එනම් අංකුරයේ දෘඪතාව, පත්‍ර ආනතිය කෝණය (FIA) භාවිතා කළ හැකි බව හඳුනා ගන්නා ලදී. එස්. එල්. 2013 ශ්‍රේණියෙහි, කළු දුඹුලු රෝගය සඳහා ඉතා ප්‍රතිරෝධී ප්‍රභේද 29ක් සහ ප්‍රතිරෝධී ප්‍රභේද 18ක් ද, පත්‍ර ප්‍රදාහ රෝගය සඳහා ඉතා ප්‍රතිරෝධී ප්‍රභේද 60ක් සහ ප්‍රතිරෝධී ප්‍රභේද 20ක් ද හඳුනා ගැනීම.

උක් ගොවිපොළ යාන්ත්‍රිකකරණ වැඩසටහන යටතේ උක් වගාව ආශ්‍රිත යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින්ගේ දක්ෂ ගබඩාව සංවර්ධනය කිරීම සහ එය, ආසියා පැසිෆික් කලාපය සමඟ යාවත්කාලීන කිරීම අවසන් කරන ලදී. උක් ගොවිපොළ යාන්ත්‍රිකරණ වැඩසටහන යටතේ රෝද දෙකේ ට්‍රැක්ටරයකට සවිකොට ක්‍රියාකළ හැකි පොහොර යොදනය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම, උක් පර්යේෂණ ආයතනය විසින් සාදන ලද කාබනික පොහොර කැටිති යෙදීම් සඳහා පොහොර මැනීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සහ රසායනාගාර තත්ව යටතේ ජෛව අඟුරු නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ සැකසීම අවසන් කරන ලදී. තවද, ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයෙහි උණු දිය ප්‍රතිකාර ඒකකයේ විදුලි පද්ධතිය, ජල සංසරණ පද්ධතිය සහ තාපන ඒකකය වැඩිදියුණු කිරීම සහ ඇතිමලේ වැවිලි (පුද්ගලික) සමාගමෙහි නව ස්වයංක්‍රීය උණු දිය ප්‍රතිකාර ඒකකය ස්ථාපනය කිරීමේ කටයුතු සහය දක්වන ලදී. විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතයෙන් ඔ්‍රබ්න කැමරා ඡායාරූප විශ්ලේෂණය සඳහා පසුබිම ස්ථාපිත කර උක් පර්යේෂණ ආයතනීය ගොවිපොළේ RGB රූප සහිතව මූලික රූපගත කිරීම් පරීක්ෂණයක් සිදු කිරීමත්, සංවේදකයකින් හෝ මානව පාලන යෙදුමකින් දත්ත රැස් කිරීමට සහ එම දත්ත අන්තර්ජාලය තුළ ගබඩා කිරීමට හා අවශ්‍ය විටෙක විමසිය හැකි ආකාරයට මූලික මට්ටමේ පරිගණක වැඩසටහනක් සංවර්ධනය කිරීමත් සිදු කරන ලදී.

සැකසුම් තාක්ෂණ පර්යේෂණ වැඩසටහන යටතේ ගුණාත්මක හකුරු නිෂ්පාදනය සඳහා SL 07 5931, SL 07 3570 සහ SL 07 3530 යන SL 2007 ශ්‍රේණියේ ඉතා සුදුසු ප්‍රභේද ලෙස හඳුනා ගන්නා ලදී. පොස්පේට් ද්‍රාව්‍ය ක්ෂුද්‍ර ජීවීන් සඳහා වාහක මාධ්‍යයක් නිපදවීමට සීනි කර්මාන්තශාලා සහ ස්කාගාර අපද්‍රව්‍ය භාවිතා කිරීමේ විභවය ඇගයීම සඳහා SL 96 128 ප්‍රභේදය සමඟ ක්ෂේත්‍ර අත්හදා බැලීමක් පවත්වා ගෙන යන ලදී. සීනි අස්වැන්න වැඩි කිරීම සඳහා නිර්දේශ ලබා දීම පිණිස, SL 96 128 ප්‍රභේදයේ ක්‍රියාකාරීත්වය ඇතිමලේ සීනි කම්හලේ විශාල මෝල් පරීක්ෂණ සිදුකරන ලදී. තවද, එස්. එල්. 96 128 සහ එස්. එල්. 98 2524 ප්‍රභේදවල පසු අස්වනු හායනය පෙබරවාරි සහ ජූලි මාස පදනම් කරගෙන විශ්ලේෂණය කරන ලදී. උඩවලවේ උක් පර්යේෂණායතනයේ හකුරු නිෂ්පාදන ඒකකය සඳහා භ්‍රමණ අංශක 3ක් සහ VFD වේග පාලන යාන්ත්‍රණයක් සහිත අර්ධ ස්වයංක්‍රීය කැලතීමේ පද්ධතියක් සැලසුම් කිරීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට සහ හකුරු නිෂ්පාදන ඒකකය සඳහා යෝජිත අර්ධ ස්වයංක්‍රීය කැලතීමේ පද්ධතියට ගැලපෙන පරිදි නව හකුරු පෑන් නිර්මාණය කිරීම.

උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ 2021 වසරේ මිල ගණන් මත යාවත්කාලීන කරන ලදී. 2021 වසරේ මිල ගණන් මත උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ යාවත්කාලීන කිරීම. වගා කරන ලද උක් හෙක්ටයාරයකට සාමාන්‍ය පිරිවැය සෙවනගල වාරි පෝෂිත සහ වර්ෂා පෝෂිත අංශ, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ කම්හල් ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු. 411,903, රු. 313,519, රු. 227,809, රු. 290,600ක් සහ රු.227,086කි. සෙවනගල උක් හෙක්ටයාරයකින් වසරකට සාමාන්‍ය ශුද්ධ ආදායම රුපියල් 245,034 සහ 149,356 ලෙස පිළිවෙලින් වාරි සහ වර්ෂා පෝෂිත කලාප සඳහා වාර්තා විය. වර්ෂා පෝෂණය යටතේ පැල්වත්තේ සහ වාරි පෝෂණය යටතේ ගල්ඔය ප්‍රදේශයේ ශුද්ධ ආදායම පිළිවෙළින් හෙක්ටයාරයකට රු. 121,503ක් සහ රු.135,449ක් වූ අතර, වර්ෂා පෝෂණය යටතේ ඇතිමලේ රු. 108,914ක් වසරකට ශුද්ධ ආදායම ලෙස වාර්තා විය.

2020 වසර තුළ සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය සීනි කර්මාන්තවල උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු. 21,156, රු. 19,184 සහ 23,330ක් විය. ඒ අනුව 2020 දී සෙවනගල වාරි අංශයේ, පැල්වත්ත වර්ෂා පෝෂිත අංශයේ සහ ගල්ඔය ඉඩම් හෙක්ටයාරයකින් නිෂ්පාදනය කරන ලද උක්වල වාණිජ වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 2.3, මිලියන 1.05 සහ මිලියන 1.6 ක් වූ අතර, එය තරහකාරී බෝගවල ආදායමට වඩා බෙහෙවින් වැඩි විය. 2021 වසර තුළ සීනි ආනයනය ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් ටොන් 552,000ක් සහ රු. බිලියන 51.4කි. ශ්‍රී ලංකාවේ සීනි ආනයන ප්‍රමාණයට සහ දේශීය

වෙළෙඳපොළේ සීනි සිල්ලර මිලට බලපාන සාධක විශ්ලේෂණය කරන ලදී. මූර්ත සීනි ආනයන බද්ද සහ දේශීය සීනි නිෂ්පාදන ප්‍රමාණය සීනි ආනයන ප්‍රමාණයට සහ ගෝලීය වෙළෙඳපොළේ සීනි මිල, විනිමය අනුපාතය සහ මූර්ත ආනයන බද්ද සැලකිය යුතු ලෙස දේශීය වෙළෙඳපොළේ මූර්ත සීනි මිලටද බලපාන බව සොයා ගන්නා ලදී.

කොවිඩ් තත්ත්වයන් හේතුවෙන් සැලසුම් කළ පුහුණු ක්‍රියාකාරකම් සීමා කළද, තාක්ෂණ හුවමාරු වැඩසටහනක් පැවැත්වීම මගින් පර්යේෂණ සොයාගැනීම් භාවිතය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ආයතනය විසින් සංවර්ධනය කරන ලද උක් ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම සහ උක් සමඟ අතුරු බෝග වගා කිරීම පිළිබඳව අවධාරණය කරන ලදී. පාංශු සාරවත් කළමනාකරණය සහ රෝග හා පළිබෝධ කළමනාකරණය පිළිබඳව ගොවීන් සහ සීනි සමාගම්වල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී. ගොවීන් සඳහා පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 22ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පැවැත්වීමෙන් ගොවීන් 195 දෙනෙකු සහ ක්ෂේත්‍ර නිලධාරීන් 135 දෙනෙකුට නව උක් තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

- සෙවනගල, පැල්වත්ත, සියඹලාණ්ඩුව සහ හිඟුරාන ප්‍රදේශවල ගොවි ක්ෂේත්‍ර නිරීක්ෂණ 56ක් සිදු කිරීම.
- සීනි කර්මාන්ත ආශ්‍රිත ප්‍රදේශවල උක් ප්‍රභේද සහ අතුරු බෝග වගා කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 87ක් ස්ථාපනයකොට පවත්වාගෙනයාම.
- උක් පර්යේෂණ ආයතනීය පුවත් හසුනෙහි වෙළුම් තුනක් ප්‍රකාශයට පත් කිරීම.
- උක් ක්ෂේත්‍රයේ පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර පණිවිඩ හුවමාරු කිරීම සඳහා SRI TTD e-SMS සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම, SRI FB පිටුව හරහා සීනි කර්මාන්තයේ තොරතුරු බෙදාගැනීම අඛණ්ඩව සිදුකිරීම සහ ආයතනීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
- කාබනික උක් වගාව පිළිබඳ ආයතනයේ සංශෝධිත පර්යේෂණ වැඩසටහනට අනුකූලව උඩවලව පර්යේෂණ ගොවිපොළ, ගල්ඔය සහ ඇතිමලේ සීනි සමාගම්වල ක්ෂේත්‍රයන්හි කාබනික උක් වගාව පිළිබඳ නිරීක්ෂණ ක්ෂේත්‍ර තුනක් ස්ථාපිත කර නිරීක්ෂණ ලබා ගනිමින් සිටින අතර, සීනි සමාගම්වල කෘෂිකාර්මික කාර්ය මණ්ඩලය සහ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2022 දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

මීට අමතරව, ආයතනය මගින් පාසල්, කාර්මික විද්‍යාල, කෘෂිකාර්මික විද්‍යාල සහ විශ්වවිද්‍යාලවල සිසුන්ට පුහුණු හා සේවා ලබා දීම මෙන්ම, උක් කර්මාන්තයේ දියුණුවට සම්බන්ධ වීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය තොරතුරු ලබා දෙන ලදී.

සීනි කර්මාන්තය දියුණු කිරීමට දායක වීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

- කිලිනොච්චියේ ස්කන්ධපුරම් ප්‍රදේශයේ උක් වගාව ව්‍යාප්ත කිරීමට තාක්ෂණික සහය ලබා දීම.
- ආනවිල්ලුන්තාන් සැකසුම් ඒකකය මඟින් කිලිනොච්චිය වෙළෙඳපොළ සඳහා උක් හකුරු සහ සිරප් හඳුන්වා දීම.
- වන්නේරිකුලම් බිජ තවාන නඩත්තු කිරීම.
- උක් වගාව ව්‍යාප්ත කිරීම සඳහා කිලිනොච්චි, විශ්වමඩු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට තාක්ෂණික සහායවීම.

සමාලෝචිත වර්ෂය තුළ, ආයතනයේ ශ්‍රම බල අවශ්‍යතා ශක්තිමත් කිරීම සඳහා පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණක සහ ප්‍රසම්පාදන නිලධාරී යන තනතුරුවලට බඳවා ගැනීම සිදුකරන ලදී. සුදුසුකම් ලත් අපේක්ෂකයින් නොමැති වීම හේතුවෙන් ප්‍රධාන පර්යේෂණ නිලධාරී/තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී පුරප්පාඩු පිරවීමට නොහැකි විය. ආයතනයේ පුළුල් වූ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික සහ පරිපාලන සහායක කාර්ය මණ්ඩලයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා වැඩි කිරීම සඳහා සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. දිගු කාලීන සහ කෙටි කාලීන පුහුණු අවස්ථා ලබා දීමෙන් කාර්ය මණ්ඩලයේ ධාරිතා ගොඩනැගීම අඛණ්ඩව සිදු කරන ලදී. පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකුට ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන නිවාඩු ලබා දී ඇත. මීට පෙර අධ්‍යයන නිවාඩු ලබාගත් පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල අඛණ්ඩව නියැළෙන ලදී.මීට අමතරව. එක් සංවර්ධන නිලධාරියෙකුට දිගු කාලීන පශ්චාත් උපාධි පුහුණුව සඳහා අවස්ථාව හිමි වූ අතර, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සහ ගණකාධිකාරීවරියට ආයතනයේ සේවයට අදාළ විෂයයන් සඳහා දීර්ඝ කාලීන පශ්චාත් උපාධි පුහුණුව සඳහා අවස්ථාව ලබා දෙන ලදී. තවද, පර්යේෂණ, තාක්ෂණික, ගිණුම්කරණ සහ පරිපාලන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයට අදාළ කෙටි පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දෙන ලදී.

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා යටිතල පහසුකම් අවශ්‍යතා සැපයීම සහ කාර්ය මණ්ඩලය සඳහා හිතකර සේවා පරිසරයක් සැපයීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී.

I බෝග හා සම්පත් කළමනාකරණ, බෝග පෝෂණ අංශ, පෙව තාක්ෂණ විද්‍යාගාර සහ සම්මන්ත්‍රණ ශාලාව වැඩිදියුණු කිරීම, ශ්‍රවණාගාරයක් සඳහා පැරණි කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ ආයතන භූමිය වටා වැට ප්‍රතිසංස්කරණය කිරීම.

II අත්‍යාවශ්‍ය රසායනාගාර/කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම.

මෙරට උක් කර්මාන්තයේ දියුණුවේ වත්මන් මෙන්ම අනාගත අවශ්‍යතා අනුව එහි විෂය පථය සහ අධිකාරිය පුළුල් කිරීම සඳහා උක් පර්යේෂණ ආයතන පනත සංශෝධනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ආයතනයේ මෙහෙය ඉටු කිරීම සඳහා වූ ප්‍රධාන සීමාකාරී සාධකය වූයේ පුහුණු සහ පළපුරුදු ශ්‍රම බලකායේ හිඟය සහ නියමිත වේලාවට ප්‍රතිපාදන නොලැබීමයි. විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා ගැනීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු අතර, එය ආයතනයේ අනිවාර්ය කාර්යයන් ඉටු කිරීම සඳහා එහි පැවැත්ම සඳහා ඉතා වැදගත් වේ.



ආචාර්ය එම්.එස්. පෙරේරා
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

කාර්යසාධන චාර්තාව

උක් පර්යේෂණ ආයතනයේ ප්‍රගතිය සහ කාර්ය සාධන වාර්තාව
2021 දෙසැම්බර් 31 දිනට

1. උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම - 2021 යටතේ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති / ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

2021 උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති අටක් යටතේ ක්‍රියාකාරකම් හැට අටක් (68) සිදු කරන ලදී.
උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම -2021 ට අනුකූලව 2021 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද ව්‍යාපෘති අටේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 01 සහ 02වගුවන්හි ඉලක්ක වලට ඉදිරියෙන් සඳහන් කර ඇත.

වගුව 1. 2021 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන ලද ව්‍යාපෘති සඳහා ඉලක්කයට සාපේක්ෂව භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය

ව්‍යාපෘති	භෞතික ප්‍රගතිය (ප්‍රතිශතය)	
	සාක්ෂාත් කර ගත් ප්‍රගතිය	ඉලක්කය
1. උසස් වර්ගයේ උක් ප්‍රභේද සංවර්ධනය කිරීම	90	100
2. වැඩිදියුණු කළ බෝග කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය	95	100
3. උක් වගාව සඳහා පාංශු සාරවත් කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය කිරීම	95	100
4. උක් වගාවෙහි පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය	95	100
5. උක් වගාව සඳහා සුදුසු යන්ත්‍රෝපකරණ සංවර්ධනය හඳුන්වාදීම	90	100
6. උක් වගාවෙහි එකතු කළ අගය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය සහ කාර්යක්ෂම කිරීම	90	100
7. උක් වගාව පිළිබඳ දැනුම හා තාක්ෂණය බෙදා හැරීම	90	100

වගුව 2. 2021 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ 2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන ලද ව්‍යාපෘති සඳහා ඉලක්කයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය

ව්‍යාපෘති	මූල්‍ය ප්‍රගතිය (ප්‍රතිශතය)		
	ඉලක්කය (මිලියන .රු)	සාක්ෂාත් කර ගත් ප්‍රගතිය .රු) (මිලියන	ප්‍රගතිය (ප්‍රතිශතය)
1. උසස් වර්ගයේ උක් ප්‍රභේද සංවර්ධනය කිරීම	36.5	33.57	92
2. වැඩිදියුණු කළ බෝග කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය	13.86	13.86	100
3. උක් වගාව සඳහා පාංශු සාරවත් කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය කිරීම	13.93	13.93	100
4. උක් වගාවෙහි පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් සංවර්ධනය	17.72	17.72	100
5. උක් වගාව සඳහා සුදුසු යන්ත්‍රෝපකරණ සංවර්ධනය/ හඳුන්වාදීම	6.36	6.36	100
6. උක් වගාවෙහි එකතු කළ අගය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය සහ කාර්යක්ෂම කිරීම	5.40	4.63	86
7. උක් වගාව පිළිබඳ දැනුම හා තාක්ෂණය බෙදා හැරීම	27.38	23.25	85

වර්ෂයේ අයත්කරගත් ජයග්‍රහණයන් 2021

01. ආනයනික උක් ප්‍රභේද 29ක් (වියට්නාමයෙන් සහ චීනයෙන් ආනයනය කරන ලද වර්ග පිලිවෙලින් 20ක් සහ 9ක්) සහ බීජ පැළ සඳහා චීනයෙන් ආනයනය කරන ලද මුහුම් 25 කින් නිෂ්පාදනය කරන ලද බීජ පැළ උක් ඡනප්ලාස්මයට එකතු කිරීම සහ දේශීය වාණිජ වගාවන් සඳහා ඉහළ සීනි අන්තර්ගතයක් සහිත ආනයනික උක් ප්‍රභේදවල යෝග්‍යතාවය ඇගයීම .
02. වාණිජ වගාව සඳහා නිකුත් කිරීමට පෙර මහා පරිමාණ ඇගයීම සඳහා උසස් ලක්ෂණ පෙන්වන 2002 ශ්‍රේණියේ ප්‍රභේද 27ක් සහ 2003 ශ්‍රේණියේ ප්‍රභේද 27ක් ලංකා සීනි සමාගම (පැල්වත්ත සහ සෙවනගල) ,ගල්ඔය වැවිලි සමාගම සහ ඇතිමලේ වැවිලි සමාගම්වල ක්ෂේත්‍රයන්හි ගුණනය කිරීම .
03. සීමාසහිත ලංකා සීනි සමාගම (පැල්වත්ත සහ සෙවනගල), ගල්ඔය වැවිලි සමාගම සහ ඇතිමලේ වැවිළි සමාගම් හි නිරීක්ෂණ ක්ෂේත්‍ර පිහිටුවීම මගින් විවිධ කෘෂි පාරිසරික තත්ත්වයන් යටතේ විදේශීය ප්‍රභේද ඇගයීම අඛණ්ඩව සිදු කිරීම.
04. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පර්යේෂණ වැඩසටහනක් ලෙස, සෙවනගල සීනි කර්මාන්ත ප්‍රදේශයේ උක් වගාවේ බිංදු වාරිමාර්ග පද්ධතිය ඇගයීම.
05. ලංකා සීනි සමාගමේ පැල්වත්ත ඒකකයෙහි උණු දිය ප්‍රතිකාර ඒකකයෙහි විදුලි පද්ධතිය, ජල සංසරණ පද්ධතිය සහ තාපන ඒකකය වැඩිදියුණු කිරීම හා සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස ඇතිමලේ වැවිළි සමාගමෙහි නව ස්වයංක්‍රීය උණුදිය ප්‍රතිකාර ඒකකය ස්ථාපනය කිරීම මගින් නිරෝගී බීජ උක් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
06. කොම්පෝස්ට් සැකසීම සඳහා පාංශු ක්ෂුද්‍රජීවී එන්නතක් හඳුන්වාදීම සහ ලංකා සීනි සමාගම සෙවනගල සඳහා පෙරහන් මඩ සහ විනෑෂ්වලින් කොම්පෝස්ට් සකස් කිරීමට තාක්ෂණික සහාය ලබා දීම .
07. උක් වගාවේ වල් පැලෑටි පාලනය කිරීමට පෙර මතුවන අවධියේදී ඵලදායී නව වල් නාශකයක් ලෙස Saflufenacil 68 g/L + Dimethanamide P 600 g/L EC හඳුනා ගැනීම,
08. උක් සලබයන් මර්දනය කිරීම සඳහා ක්ලෝරන්ට්‍රනිලිප්‍රෝල් 0.4% (w/w) ඵලදායී රසායනික ද්‍රව්‍යයක් ලෙස හඳුනා ගැනීම හා උක් වගාවන්හී පළිබෝධ සහ රෝග තත්ත්වයන් නිරීක්ෂණය කර අවශ්‍ය නිර්දේශ ලබාදීම.
09. පාංශු ක්ෂුද්‍ර පෝෂකයක් වන සින්ක් (Zn) SL 96 128 ප්‍රභේදයේ උක්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ධනාත්මක බලපෑමක් ඇතිකරන බව හඳුනා ගැනීම .
10. කාබනික පොහොර සහ ජෛව රසායනික හා ජෛව පාලන ක්‍රමවේද හඳුන්වාදීම මගින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව අකාබනික ගොවිතැන කාබනික උක් වගාවක් බවට පත් කිරීමේ වැඩසටහනක් සංවර්ධනය කිරීම .
11. උක් වගාව ආශ්‍රිත යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින්ගේ දක්ෂ ගබඩාවක් සංවර්ධනය කිරීම සහ ආසියා පැසිෆික් කලාපයට අදාළ දක්ෂ සමග යාවත්කාලීන කිරීම.
12. SRI විසින් සාදන ලද කාබනික පොහොර කැටිති යෙදීම සඳහා පොහොර යෙදීමේ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම සහ අන්තර් ජේළි පොහොර යෙදීම සඳහා නව රෝද දෙකේ ට්‍රැක්ටර් සවිකර ඇති පොහොර කැටිති යෙදීමේ යන්ත්‍රය ඇගයීම.
13. ආයතනයේ තාක්ෂණ හුවමාරු වැඩසටහනේ දී පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 22ක් පවත්වමින් ගොවීන් 195 දෙනෙකු සහ ක්ෂේත්‍ර නිලධාරීන් 135 දෙනෙකුට නව උක් තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීම .
14. උක් වගාවේ විවිධ අංශ පිළිබඳ උපදේශන පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා බෙදා හැරීම සහ සීනි කර්මාන්ත ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාන 87ක් ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.
15. කාබනික උක් වගාව පිළිබඳ ආයතනයේ සංශෝධිත පර්යේෂණ වැඩසටහනට අනුකූලව පර්යේෂණ ගොවිපොළ, ගල්ඔය සහ ඇතිමලේ සීනි සමාගම්වල කාබනික උක් වගාව පිළිබඳ නිරීක්ෂණ ක්ෂේත්‍ර තුනක් ස්ථාපිත කිරීම.
16. පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර SRI TTD eSMS සේවාව අඛණ්ඩව ක්‍රියාත්ම කිරීම .
17. ආයතනයේ පුවත් හසුනෙහි වෙළුම් තුනක් ප්‍රකාශයට පත් කිරීම .

1. උක් වගා අංශයේ දියුණුව සඳහා ගෙන ඇති විශේෂ වැඩසටහන් .ක්‍රියාකාරකම් / ව්‍යාපෘති /

I. වාණිජ වගාව සඳහා දැනට උක් පර්යේෂණායතනයේ අභිජනනය උක් ප්‍රභේදවල පවතින අධික සීනි අන්තර්ගතයක් සහිත සහ ආනයනික උක් වර්ග හඳුන්වා දීමේ වැඩසටහන.
II. ක්ෂේත්‍ර මට්ටමේ නිරීක්ෂණ සඳහා ඉහළ ඵලදායීතාවයක් සහිත උක් ප්‍රභේද සීනි කර්මාන්තයට හඳුන්වා දීම.
III. උක් පර්යේෂණ ආයතනයේ කොළඹ කාර්යාලයේ තොරතුරු සහ නිෂ්පාදන වාණිජකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.
IV. උක් කර්මාන්තය සඳහා නව දියුණු කරන ලද උක් ප්‍රභේදයන් හි ප්‍රාථමික උක් බීජ නිෂ්පාදනය හා සැපයීම
V. සීනි නිෂ්පාදනය සම්බන්ධ තොරතුරුවෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයට උක් පර්යේෂණායතනයේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම.
VI. කාබනික පොහොර භාවිතය, පළිබෝධ සහ රෝග කළමනාකරණය, දිරාපත් වූ පසෙහි සාරවත් බව වැඩි දියුණු කිරීම යනාදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොහොර යෙදීම ඇතුළු උක් බෝග කළමනාකරණය පිළිබඳ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
VII. උක් වගාවන් තුළ පළිබෝධ සහ රෝග පැතිරීම වැළැක්වීම සඳහා බෝග ආරක්ෂණ සේවා සිදු කිරීම
VIII. හකුරු සහ සිරප් නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උක් වගාව ව්‍යාප්ත කිරීම

2. මූල්‍ය ප්‍රගතිය ප්‍රාග්ධනය / පුනරාවර්තන / අනුමත මුදල / අක් මුදල / මූල්‍ය ප්‍රගතිය/අතේ ඇති බිල්පත් (2021.12.31 දිනට)

වියදම් පිළිබඳ විස්තර	අනුමත මුදල (රු.මිලියන)	අක් මුදල (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	අතේ ඇති බිල්පත් (රු. මිලියන)
ප්‍රාග්ධනය	80	55.80	55.80	-
පුනරාවර්තන	285	269.9	269.9	15.10
මුළු වියදම	365	325.70	325.70	15.10

3. 2022 වර්ෂය තුළ සිදු කිරීමට නියමිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්/වැඩසටහන්

උක් පර්යේෂණ ආයතනය මඟින් සිදු කරනු ලබන පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් වලට අමතරව, පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් / වැඩසටහන් /2022 වර්ෂය තුළ දී සිදු කෙරේ.

I. වාණිජ වගාව සඳහා දැනට උක් පර්යේෂණායතනයේ අභිජනනය උක් ප්‍රභේදවල පවතින අධික සීනි අන්තර්ගතයක් සහිත සහ ආනයනික උක් වර්ග හඳුන්වා දීමේ වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාම.

II. ක්ෂේත්‍ර මට්ටමේ නිරීක්ෂණ සඳහා ඉහළ ඵලදායීතාවයක් සහිත උක් ප්‍රභේද සීනි කර්මාන්තයට හඳුන්වා දීමේ වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාම

III. උක් පර්යේෂණ ආයතනයේ කොළඹ කාර්යාලයේ තොරතුරු සහ නිෂ්පාදන වාණිජකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම.

IV. උක් කර්මාන්තය සඳහා නව දියුණු කරන ලද උක් ප්‍රභේදයන් හි ප්‍රාථමික උක් බීජ නිෂ්පාදනය හා සැපයීම

V. උක් වගාව ට ප්‍රශස්ථ කෘෂිකාර්මික තාක්ෂණයක් යෙදීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම

VI. සීනි නිෂ්පාදන අංශය පිළිබඳ තොරතුරු ලබාගතහැකි ආකාරයට උක් පර්යේෂණායතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

VII. කාබනික පොහොර භාවිතය, පළිබෝධ සහ රෝග කළමනාකරණය, දිරාපත් වූ පසෙහි සාරවත් බව වැඩි දියුණු කිරීම යනාදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පොහොර යෙදීම ඇතුළු උක් බෝග කළමනාකරණය පිළිබඳ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.

VIII. උක් වගාවන් තුළ පළිබෝධ සහ රෝග පැතිරීම වැළැක්වීම සඳහා බෝග ආරක්ෂණ සේවා සිදු කිරීම.

IX. කුඩා පරිමාණ හකුරු සහ සිරප් නිෂ්පාදන ග්‍රාමීය කර්මාන්ත ඇති කිරීමේ උක් ගම්මාන ව්‍යාපෘතිය.

ආංශික වාර්තා



බෝග වැඩිදියුණු කිරීමේ අංශය

බෝග වැඩිදියුණු කිරීමේ අංශය

කාර්ය මණ්ඩලය

ඒ. එම්. එම්. එස්. පෙරේරා මිය (විද්‍යාවේදී, විද්‍යාපති)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී
කේ. පී. වික්‍රමසිංහ මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
ආර්. ආර් .ආර් .ඩී රණතුංග මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී
ඒ. ජේ. එම්. ඩී. එම්. සිරිවර්ධන මහතා (කෘෂි විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී(30.04.2021 දින සිට ඉල්ලා අස්වී ඇත)
ඒ. එල්. සී. කුමාරි මිය	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
ආර්. ඒ. ප්‍රේමවන්ද්‍ර මයා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
ඩී. වීරසිංහ මයා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
එම්. කේ. ඩී. උබේසේන මයා	-	තාක්ෂණ නිලධාරී
එස්. එච්. කරුණාරත්න මයා	-	රසායන/ක්ෂේත්‍ර සහයක
ආර්. ජී. එස්. එල්.ප්‍රේමරත්න මයා	-	රසායන/ක්ෂේත්‍ර සහයක (බෝග ආරක්ෂණ අංශයට මාරු කරන ලදි)

ජයග්‍රහණ

පර්යේෂණ

- ආනයනය කරන ලද උක් ප්‍රභේද 29ක් (වියට්නාමයෙන් ප්‍රභේද 20ක් සහ චීනයෙන් ප්‍රභේද 9ක්) ජාන ප්ලාස්මයට එකතු කිරීම සහ තෝරා ගැනීමේ වැඩසටහන සඳහා චීනයෙන් ආනයනය කරන ලද මුහුම් 25ක සත්‍ය බීජවලින් ලබා ගත් බීජ පැළ ඇතුළත් කිරීම.
- දෙනියාය එන්සෙල්වත්ත උක් අභිජනන මධ්‍යස්ථානයේ උක් දර්ශ 1,659 ද්විත්ව පාත්ති ලෙස සංරක්ෂණය කිරීම සහ උඩවලව උක් පර්යේෂණ ආයතන ගොවිපොළෙහි, වාණිජ හා වානිජකරණයට ආසන්න උක් ප්‍රභේද 45ක් අභිජනක බීජ තවාන් ලෙස නඩත්තු කිරීම.
- ක්ෂේත්‍ර ලන්තෑරුම් ක්‍රමය හා දියර මුහුම්කරන ක්‍රමය යොදාගනිමින් මුහුම් 1,025ක් සිදු කිරීම. එම මුහුම් සීනි සහ උක් අස්වැන්න වැඩි කර ගැනීම සඳහා සහ රෝගවලට (කළු දුඹුරු රෝගය, ශල්ක පත්‍ර රෝගය, සුදු පත්‍ර රෝගය) ඔරොත්තු දෙන ප්‍රභේද නිපදවීම සඳහා දිශානුගත මුහුම් සිදු කිරීමට යොදා ගැනිම. මෙම සියලු මුහුම්වල සත්‍ය බීජ සැකසීම් සිදු කිරීම.
- මහා පරිමාණ ඇගයීම් සඳහා 2002 පෙළින් උසස් උක් ප්‍රභේද 27ක් ද, 2003 පෙළින් ප්‍රභේද 27ක් ද ලංකා සීනි(පුද්ගලික) සමාගම පැල්වත්ත, ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම, ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගම හා ලංකා සීනි (පුද්ගලික) සමාගම, සෙවනගල ක්ෂේත්‍රයන්හි ගුණනය කිරීම.
- මහා පරිමාණ ඇගැයීම් සඳහා උසස් උක් ප්‍රභේද උඩවලව පරිශ්‍රයේ ගුණනය කිරීම; 2004 පෙළින් ප්‍රභේද 54ක් සහ 2005 පෙළින් ප්‍රභේද 25ක්.
- 2006 පෙළින් ප්‍රභේද 23ක්, 2007 පෙළින් ප්‍රභේද 24ක්ද, 2008 පෙළින් ප්‍රභේද 22ක්, 2009 පෙළින් ප්‍රභේද 22ක් සහ 2010/11 පෙළින් ප්‍රභේද 58ක් ලෙස මහා පරිමාණ ඇගයීමට පෙර අවසන් අදියර ඇගයීම් සිදු කිරීම.
- ලංකා සීනි (පුද්ගලික) සමාගම, සෙවනගල සහ පැල්වත්ත, ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම, හිඟුරණ, ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගම, සියඹලාණ්ඩුව යන ස්ථානවල විදේශීය ප්‍රභේද ඇගයීම.

පුහුණු අභ්‍යාසලාභීන්

- කුණ්ඩසාලේ කෘෂිකාර්මික පාසලේ සිසුන් දෙදෙනෙකුහට ශාක අභිජනනය සම්බන්ධ පුහුණුවක් ලබාදීම.



බෝග හා සම්පත් කළමනාකරණ අංශය

බෝග සහ සම්පත් කළමනාකරණ අංශය

කාර්ය මණ්ඩලය

ඒ. එල්. සී. ද සිල්වා මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
ජී. ඒ. ඒ. චතුරංග මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී
පිබි .ආර් .. චන්ද්‍රසේන මයා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	ගොවිපල අධිකාරී
ඩබ්ලිව්. ජී. නිමල් මයා	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
අයි. පී. මානවඩු මයා (එච්. එන්. ඩී)	-	තාක්ෂණ නිලධාරී
ඩී. එම්. ජී. එච්. චතුරංග මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී

ජයග්‍රහණ

පර්යේෂණ

- උක් වගාවේ වල් පැළැටි පාලනය සඳහා නව වල් නාශකයක් වන, සැෆ්ලුෆෙනසිල් 68 ග්‍රෑම් /ලී + ඩයිමේතනමයිඩ්. පී 600 ග්‍රෑම් /ලී. පූර්ව නිර්ගමන අවස්ථාවේ දී යෙදීම ඵලදායී බව හඳුනා ගැනීම.
- වර්ෂාපතන තත්වයන් යටතේ උක් වගාවේ වල් මර්දනය සඳහා පොලිතීන් වසුන් භාවිතා කිරීම, රසායනික හා අතින් වල් නෙලීමේ ක්‍රමය සමග සැසඳීමේ දී සමාන අස්වැන්නක් ලැබෙන බව හඳුනා ගැනීම.
- 2003 ශ්‍රේණියේ නව උක් ප්‍රභේද වන SL 03 336, SL 03 341, SL 03 425, SL 03 442, SL 03 762, SL 03 983, SL 03 1025, SL 03 1077, SL 03 1134, SL 03 5428, SL 03 5441 සහ SL 03 5445 යන ප්‍රභේදවල බෝග සිටුවීමේ කාලයට සාපේක්ෂව වයස සමග පරිණත වීමේ රටාව හඳුනා ගැනීම.
- 2003 ශ්‍රේණියේ නව උක් ප්‍රභේදයක් වන SL 03 983 වයස මාස 10-11 දී මෝරන ප්‍රභේදයක් බව හඳුනා ගැනීම සහ එහි සීනි ප්‍රමාණය මාස 10-11කින් පසු අඩු වන බව හඳුනා ගැනීම.

සංවර්ධන කටයුතු

- කිලිනොච්චි ස්කන්ධපුරම් ප්‍රදේශයේ උක් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
- ආනවිල්ලුන්තාන් සැකසුම් ඒකකය මගින් කිලිනොච්චි දේශීය වෙළෙඳපොළ සඳහා උක් හකුරු සහ පැණි හඳුන්වාදීම.
- වන්නේරිකුලම් බීජ උක් තවාන නඩත්තු කිරීම.
- විශ්වමඩු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ගොවිපොළෙහි උක් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.

සේවාවන්

- බීජ තවාන් සහ පර්යේෂණ වගාවන් ස්ථාපිත කිරීම සඳහා හෙක්ටයාර 42ක බිම් සකස් කිරීම.
- පර්යේෂණ ගොවිපොළේ D4 සහ D5 ප්‍රදේශවල හෙක්ටයාර් 4ක බීජ තවානක් නඩත්තු කිරීම.
- ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සෙවනගල කර්මාන්තශාලාව වෙත උක් මෙට්‍රික් ටොන් 380.68ක් සැපයීම.
- සෙවනගල ලංකා සීනි (පුද්ගලික) සමාගම සඳහා බීජ උක් මෙට්‍රික් ටොන් 2.83ක් ලබාදීම.
- ගොවිපොළ වටා මීටර් 800ක කටුකම්බි වැට අලුත්වැඩියා කිරීම.
- පර්යේෂණ ගොවිපොළේ මාර්ගවල සහ මුඩු ප්‍රදේශවල වල් පැළැටි පාලනය කිරීම සඳහා මී හරක් රංවුවක් යොදා ගැනීම.
- පර්යේෂණ ගොවිපොළේ කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකය ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.

අභ්‍යාසලාභීන් පුහුණුකිරීම

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂකයින් වන එම්. ඩී. පරණමාන හා පී. ඒ. එච්. රුවින්කා මෙනවියගේ කාර්මික පුහුණු වැඩසටහන වෙනුවෙන් පුහුණුව ලබාදීම.



බෝග පෝෂණ අංශය

බෝග පෝෂණ අංශය

කාර්ය මණ්ඩලය

එච්. ඒ. එස්. වීරසිංහ මයා (විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනපති)	-	කාර්යයභාර පර්යේෂණ නිලධාරී
බී. ආර්. කුලසේකර මයා (කෘෂි විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී
යූ. ඩබ්. එල්. එම්. කුමාරසිරි මයා (කෘෂි විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී
ජී. එස්. උඩවත්ත මයා	-	තාක්ෂණ නිලධාරී
ඩබ්. ඒ. එස්. විජේසූරිය මිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරිනී
එම්. ඒ. ටී. තාරිකා මිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරිනී
ජේ. ගුණසිරි මයා	-	රසායනාගාර/ක්ෂේත්‍ර උප්ස්ථායක
පී. ඩබ්. ඩී. කුලතුංග මයා	-	රසායනාගාර/ක්ෂේත්‍ර උප්ස්ථායක

විශේෂ ජයග්‍රහණයන්

පර්යේෂණ

- ශ්‍රී ලංකාවේ උක් වගා සිදුකරන පාංශු කාණ්ඩ හතරක් සඳහා පොස්පරස්, පොටෑසියම් සාන්ද්‍රණයන් අනුසාරයෙන් උක් වගා භූමි-විශේෂිත පොහොර නිර්දේශයන් සකස් කිරීම.
- සෙවනගල උක් වගාවන් සිදු කරන පාංශු කාණ්ඩයන්හි පොටෑසියම් ස්වාරක්ෂක ධාරිතාව පිළිබඳව සිදු කරන ලද පර්යේෂණ අනුසාරයෙන් එම පාංශු කාණ්ඩ සඳහා වර්ගීකරණ ධූරාවලියක් සකස් කිරීම.
- සෙවනගල උක් වගා සිදු කරන ප්‍රදේශයන්හි පවතින පාංශු කාණ්ඩයන් තුළ අඩංගුවන පාංශු පොස්පරස් සාන්ද්‍රණය හා ඒවා පසේ රඳවා ගැනීම අතර පවතින විද්‍යානුකූල සම්බන්ධතාවය හඳුනාගැනීම.
- සෙවනගල උක් වගා සිදුකරන ප්‍රදේශයන්හි පවතින පාංශු කාණ්ඩයන් තුළ අඩංගුවන පාංශු ක්ෂුද්‍ර මූලද්‍රව්‍යන් (Fe, Mn, Zn සහ Cu)හි තත්ත්වය හඳුනා ගැනීම.
- සුදුසු සංයෝජයන්ගෙන් යුත් රසායනික හා කාබනික මිශ්‍රිත කැටිති පොහොර නිෂ්පාදන කිරීම හා එම පොහොර උක් වගාවන් සඳහා යෙදීමේ යෝග්‍යතාව අධ්‍යයනය උදෙසා පර්යේෂණ වගාවක් ස්ථාපිත කිරීම.
- එකිනෙකට වෙනස් වූ ගැලෙපෙන සංයෝජයන්ගෙන් යුත් රසායනික හා කාබනික මිශ්‍රිත කැටිති පොහොර නිෂ්පාදන කිරීම හා විද්‍යාගාර තත්ව පර්යේෂණයන් සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ උක් වගාවන් සඳහා යෝග්‍ය සංයුක්ත පොහොර භාවිතය හඳුනාගැනීම උදෙසා වර්ෂා සහ වාරි ජල කළමනාකරණ තත්ව යටතේ ස්ථාපිත කරන ලද පර්යේෂණ උක් වගාවේ පළමු නිරීක්ෂණ දත්ත එක් රැස් කිරීම සහ වගා පාලන කටයුතු සිදු කිරීම.
- එස් එල් 96 128 උක් ප්‍රභේදයේ ගුණාත්මය වැඩිදියුණු කිරීම් සඳහා පාංශු ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය (Zn) මගින් ඇතිකරන ධනාත්මක බලපෑම හඳුනා ගැනීම.
- ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවානගල ඒකකය සිදුකරනු ලබන කොම්පෝස්ට් සෑදීමේ ක්‍රියාවලිය සඳහා පාංශු ක්ෂුද්‍ර ජීවී මුහුම් හඳුන්වාදීම.
- ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවානගල ඒකකයේ යූරියා හා ඇමෝනියම් සල්ෆේට් පොහොර මගින් උක් වගාවට සිදුවන බලපෑම හඳුනා ගැනීම සඳහා ස්ථාපනය කරන ලද පර්යේෂණ උක් පැළ වගාවේ දත්ත එක් රැස් කිරීම සහ වගා පාලන කටයුතු සිදු කිරීම.

විශ්ලේෂණ සේවාවන්/වෙනත්

උක් විශ්ලේෂණ කටයුතු

- උක් කර්මාන්ත හා පර්යේෂණ අවශ්‍යතාවයන් වෙනුවෙන් උක් දඬු නියැදි 3,649ක් ගුණාත්මය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදුකිරීම. (බෝග වැඩිදියුණු කිරීමේ අංශය සඳහා නියැදි 2,003, බෝග සහ සම්පත් කළමනාකරණ අංශය සඳහා නියැදි 987, බෝග ආරක්ෂණ අංශය සඳහා නියැදි 210, සැකසුම් තාක්ෂණ අංශය සඳහා නියැදි 352, ආර්ථික විද්‍යා පෛවෙමිතික හා තොරතුරු තාක්ෂණ අංශය සඳහා නියැදි 97ක්) සහ ඔක්සිහාරක සීනි පරීක්ෂාව (බෝග ආරක්ෂණ අංශය සඳහා නියැදි 87ක්).
- නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්, pH සහ විද්‍යුත් සන්නායකතාව සඳහා පාංශු සාම්පල විශ්ලේෂණ කටයුතු සිදුකිරීම. (බෝග ආරක්ෂණ අංශය සඳහා නියැදි 87ක්, NLDB සඳහා නියැදි 9ක්).
- ලංකා සීනි පුද්ගලික සමාගමේ සෙවනගල ඒකකයේ ඉල්ලීමකට අනුව (වියදම් සහිතව) පාංශු සාම්පල 18ක රසායනාගාර විශ්ලේෂණ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ තත්ව සහතිකයන්ට අනුකූලව කොම්පෝස්ට් සාම්පල 12ක් සඳහා රසායනාගාර විශ්ලේෂණ කටයුතු සිදුකිරීම.

පුහුණුවීම්

- ඇඹිලිපිටිය තාක්ෂණික පුහුණු පාසලේ සිසුන් දෙදෙනෙකු සඳහා මාස 6ක රසායනාගාර සහ ක්ෂේත්‍ර පුහුණුවක් ලබා දීම.



බෝග ආරක්ෂණ අංශය

බෝග ආරක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ මිය (විද්‍යාවේදී , විද්‍යාපති)	-	පර්යේෂණ නිලධාරී (2020.11.01 සිට අධ්‍යන නිවාඩු)
ඒ. එන්. ඩබ්ලිව්. එස්. තුෂාරි මිය (විද්‍යාවේදී)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී (2021.02.01 සිට අධ්‍යන නිවාඩු)
ආචාර්ය කේ. එම්. ජී. චංචලා (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී (2021.02.01 සිට)
වයි. ඒ. පී. කේ. දයාසේන මයා	-	පර්යේෂණ නිලධාරී
ඒ. එල්. සී. කෝදාගොඩ මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
කේ.පී. හර්ෂනී මෙනවිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ආර්.කේ.පී. ජීවන්ති මෙනවිය (ආහාර තාක්ෂණ ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
එම්. ආර්. ප්‍රේමලාල් මයා	-	විද්‍යාගාර /ක්ෂේත්‍ර උපස්ථායක
ජේ. කේ. යූ. මධුසංඛ මයා	-	විද්‍යාගාර /ක්ෂේත්‍ර උපස්ථායක
ආර්. ජී. එස්. එල්. ප්‍රේමතිලක මයා	-	විද්‍යාගාර /ක්ෂේත්‍ර උපස්ථායක

පර්යේෂණ

- ක්ලෝරැන්ට්‍රනිලිපෝල් 0.4 % (w/w) පිළිබඳ අධ්‍යනය කර, එය උක් වගාවේ ප්‍රරෝහ සහ කඳන් විදින පණුවන් මර්දනය සඳහා සුදුසු පළිබෝධ නාශකයක් ලෙස හඳුනා ගැනීම.

- සුදු පත්‍ර රෝග වාහක කෘමියා වන ඒකාබද්ධ කෘමි වාහක පාලන ක්‍රමයට නව මර්දන ක්‍රම දෙකක් ඇතුළත් කිරීම.

- උක් වගාවේ අතුරු බෝගයක් ලෙස අබ වගා කිරීමෙන් උක් වගාවේ සුදු පත්‍ර රෝග වාහකයා මගින් ද්විතියිකව පැතිරියාම අවම කර ගත හැකි අතර, එමගින් උක් වගාවේ brix, බර , දියගොබ ප්‍රමාණය, ප්‍රරෝහ සහ පුරුක් විදින පණුවන්ගේ හානිය, පාංශු ක්ෂුද්‍ර ජීවී ගහනය සහ පරපෝෂිත ගහනය සඳහා බලපෑමක් සිදු නොවේ.

- උක් නෙර 02ක් අතර පරතර ඉහළ නැංවීම මගින් සුදු පත්‍ර රෝගය ද්විතීක සිදුවන වහනය අවම කර ගත හැකිය. 1.37m යන සාමාන්‍ය නෙර අතර පරතර ප්‍රමාණයට වඩා 1.5m සහ 2m පරතරයන් වලදී අවට වාහක ඝනත්වයක් වාර්තා වේ. තවද, මෙම පරතර තුනෙහිම අස්වැන්න, සීනි ප්‍රමාණය, දියගොබ ප්‍රමාණය, පළිබෝධ හානි යන සාධකයන්ගේ හඳුනා ගත හැකි වෙනසක් නැති බව තහවුරු විය.

- උක් වගාවේ පාලනය සඳහා යොදා ගත හැකි විලෝපිකයන් දෙදෙනෙකු වන ඉයුකොරලියා (කතුරන්) හා මයික්‍රැස්පිස් ඩිස්කලර් යන විශේෂ පර්යේෂණාගාරය තුළ ගුණනය සඳහා ක්‍රමවේද දියුණු කිරීම.

- පාරිසරික උෂ්ණත්වයේ ඇති ජලයේ පැය 36ක් හෝ පැය 48ක් ගිල්වා තබා 54^{0}C විනාඩි 50ක් උණුදිය ප්‍රතිකාරයට ලක්කරන ලද බීජ උක් භාවිතය මගින් ශල්කපත්‍ර ප්‍රදාහය හා සුදු පත්‍ර රෝගය අඩු කර ගැනීම සඳහා සුදුසු බව පර්යේෂණ මගින් තහවුරු කරන ලදි.

- එස් එල් 2013 පෙළෙහි උක් ප්‍රභේද 102ක් කළු දුඹුළු රෝගයට හා ශල්ක පත්‍ර ප්‍රදාහයට දක්වන ප්‍රතිරෝධීතාව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද පරීක්ෂණවලින් කළු දුඹුළු රෝගය සඳහා වඩාත් ප්‍රතිරෝධී ප්‍රභේද 29ක් ද ප්‍රතිරෝධී ප්‍රභේද 18ක් ද හඳුනා ගන්නා ලදී. තවද ශල්ක පත්‍ර ප්‍රදාහය සඳහා වඩාත් ප්‍රතිරෝධී ප්‍රභේද 60ක් ද ප්‍රතිරෝධී ප්‍රභේද 20ක් ද හඳුනා ගන්නා ලදී.

- උක් වගාවේ කළු දුඹුළු රෝගයට ප්‍රතිරෝධයන් සඳහා ජෛව රසායනික දර්ශන එනම් පත්‍රවල ඇති සම්පූර්ණ ෆිනොලීන් අන්තර්ගතය සහ රූප විද්‍යාත්මක එනම් අංකුරයේ දෘඩතාවය, පත්‍ර ආනති කෝණය (FJA) සහ ශල්ක පත්‍ර සංඛ්‍යාව යන අපේක්ෂිත වක්‍ර සලකුණු යොදාගනී. උක් වගාවේ කළු දුඹුළු රෝගයට ප්‍රතිරෝධී විශේෂ කලින් හඳුනා ගැනීම සඳහා උක් කළු දුඹුළු රෝගය ප්‍රතිරෝධී ප්‍රභේද තේරීමේ වැඩසටහන්වල හඳුනාගැනීමට මෙම ලක්ෂණ භාවිතා කිරීමේ සැලකියයුතු විභවයක් ඇත.

සේවාවන්

- වියට්නාමයෙන් ගෙන්වන ලද උක් ප්‍රභේද 22ක් චීනයෙන් ගෙන්වන ලද උක් ප්‍රභේද 09ක් සහ බීජ පැළ කිරීමෙන් ලබාගන්නා ලද පැළ ප්‍රභේද 22ක් නිරෝධායනයෙන් අනතුරුව ජාන සංචිතය වෙත නිදහස් කිරීම.

- 2020 දී චීනයෙන් ගෙන එන ලද නව ප්‍රභේද 29ක් රෝග හා පළිබෝධවලින් නිරෝධායනය කරමින් පවතින අතර, නිරන්තරව පර්යේෂණ අඛණ්ඩව සිදු කෙරේ.

- ඖෂධීය ප්‍රදේශයේ වාර්තාවේ ඇති නොදන්නා උක් රෝගයේ ව්‍යාධිජනකතාව පිළිබඳ අධ්‍යන අඛණ්ඩව සිදු කිරීම.

- කර්මාන්තායතන සහ ගොවීන්ගේ අවශ්‍යතාවය අනුව පළිබෝධ හා රෝග කළමනාකරණය කිරීමට අවශ්‍ය නිර්දේශ ලබාදීම.

පැල්වත්ත	-	පොකාබෝන් රෝගය හා වෙයන්ගේ හානි.
හිඟුරාණ	-	නොදන්නා රෝගී තත්වයන්
ඇතිමලේ	-	පොකාබෝන් රෝගය
සෙවනගල	-	ප්‍රරෝහ විදින පණුවා, මයිටා හානිය සහ ශල්ක පත්‍ර ප්‍රදාහය

අභ්‍යාශලාභීන් පුහුණු කිරීම

- රත්නපුර ජාතික ආධුනිකත්ව පුහුණු කිරීමේ අධිකාරියට අනුබද්ධ එච්. එම්. පී. පී. ද සිල්වා ශිෂ්‍යාවට 2021 ජනවාරි 11 සිට උක් බෝග ආරක්ෂණය පිළිබඳව සය මාසික පුහුණුවක් ලබාදීම.

- අනුරාධපුර රජරට විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ශිෂ්‍යාවක් වන වී. එල්. පී. ටී. හේමපාල ශිෂ්‍යාව 2021 සැප්තැම්බර් 27 සිට උක් භෝග ආරක්ෂණය පිළිබඳව එක් මාසයක පුහුණුවක් ලබාදීම.

- නයිවල උසස් තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යාවක් වන එල්. ඒ. පී. පී. වීරරත්න ශිෂ්‍යාව 2021 ඔක්තොම්බර් 11 සිට උක් භෝග ආරක්ෂණය පිළිබඳව සය මාසික පුහුණුවක් ලබාදීම.



යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය

යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ. එච්. ඩී. අබේරත්න මයා (කෘෂිකර්ම විද්‍යාවේදී)	-	කාර්යය භාර පර්යේෂණ නිලධාරී
ආචාර්ය කේ. ටී. ආරියවංශ (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති, දර්ශනපති)	-	පර්යේෂණ නිලධාරී
ඒ. එම්. එස්. ඒ. ප්‍රනාන්දු මයා (තාක්ෂණික ඩිප්ලෝමා)	-	ජ්‍යේෂ්ඨ තාක්ෂණ නිලධාරී
ඩබ්ලිව්. එම්. අනුරපාල මයා	-	තාක්ෂණ නිලධාරී
වී. අබේගුනවර්ධන මයා	-	පැස්සුම්කරු
ජී. ආරියරත්න මයා	-	වැද්දුම්කරු
ඩබ්ලිව්. ඒ. ජේමචන්ද්‍ර මයා	-	කම්මල්කරු
ඩී. එම්. එල්. වීරසිරි මයා	-	කාර්මික
ඩී. එම්. වීරසිරි මයා	-	රසායනාගාර / ක්ෂේත්‍ර උපස්ථායක

අත්පත්කර ගැනීම්

- විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතයෙන් ඩ්‍රෝන කැමරා ඡායාරූප විශ්ලේෂණය සඳහා පසුබිම ස්ථාපිත කර උක් පර්යේෂණ ආයතනීය ගොවිපලේ RGB රූප සහිතව මූලික රූපගත කිරීම් පරීක්ෂණයක් සිදු කිරීම.
- සංවේදකයකින් හෝ මානව පාලන යෙදුමකින් දත්ත රැස් කිරීමට සහ එම දත්ත අන්තර්ජාලය තුළ ගබඩා කිරීමට හා අවශ්‍ය විටෙක විමසිය හැකි ආකාරයට මූලික මට්ටමේ පරිගණක වැඩසටහනක් සංවර්ධනය කිරීම.
- ලොව පුරා උක් වගාව ආශ්‍රිත යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින් ගේ දත්ත ගබඩා කිරීමට පියවර ගැනීම හා මූලිකව ආසියා පැසිෆික් කලාපයේ දත්ත යාවත්කාලීන කිරීම.
- රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකර හැකි පොහොර යොදන යන්ත්‍රය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම.
- උක් පර්යේෂණ ආයතන මගින් සාදන ලද කාබනික පොහොර කැට යාන්ත්‍රිකව යෙදීම සඳහා පොහොර මැනීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.
- රසායනාගාර පරිමාණයෙන් ජෛව අහුරු නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ නිර්මාණය කිරීම.
- සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, පැල්වත්ත ඒකකයේ දැනට පවතින බීජ උක් උණු දිය ප්‍රතිකාර ඒකකයේ විදුලි පද්ධතිය, ජල සංසරණ පද්ධතිය සහ තාපන ඒකකය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.
- සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස ඇතිමලේ වැවිලි (පුද්ගලික) සමාගමෙහි නව ස්වයංක්‍රීය බීජ උක් උණු දිය ප්‍රතිකාර ඒකකය ස්ථාපනය කිරීමට තාක්ෂණික සහය ලබා දීම.

සේවාවන්

- උක් පර්යේෂණ ආයතනීය ගොවිපොළේ සහ කන්තලේ උක් තවානෙහි පිහිටි විදුලි වැටවල වෝල්ටීයතාවය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම.
- පර්යේෂණ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සේවා සැපයීම.
- උක් පර්යේෂණ ආයතනයේ වාහන සහ ගොවිපොළ උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම.
- උක් පර්යේෂණ ආයතනීය වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සහ එය විශ්ලේෂණය කිරීම.



සැකසුම් තාක්ෂණ අංශය

සැකසුම් තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

එස්. එම්. ටී. ඒ. මාරලන්ද මිය (කෘෂි විද්‍යාවේදී, විද්‍යාපති)	-	කාර්ය භාර පර්යේෂණ නිලධාරී
එම්. ජී. ජී. එන්. සෙව්වන්දි මිය (ඉංජිනේරු විද්‍යාවේදී)	-	පර්යේෂණ නිලධාරී
එම්. ඒ. ආර්. අයි. පෙරේරා මිය (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී
ඩබ්ලිව්. කේ. ඩී. එස්. කරුණාරත්න මයා (කෘෂි ඩිප්ලෝමා)	-	තාක්ෂණ නිලධාරී

ජයග්‍රහණයන්

පර්යේෂණ

- පොස්පේට් ද්‍රාව්‍ය ක්ෂුද්‍ර ජීවීන් සඳහා වාහක මාධ්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්තශාලා සහ ස්කාගාර අපද්‍රව්‍ය භාවිතා කිරීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා SL 96 128ප්‍රභේදය සමඟ උඩවලවේ ක්ෂේත්‍ර අත්හදා බැලීමක් පවත්වා ගෙන යාම සහ අස්වනු නෙලීම.
- ගුණාත්මක හකුරු නිෂ්පාදනය සඳහා SL 2007ශ්‍රේණියේ SL 07 5931, SL 07 3570සහ SL 07 3530වර්ග හඳුනා ගැනීම.
- චොක්ලට් සහ මසින් ඇතුළත් උක් හකුරු සංවර්ධනය කිරීම සඳහා මූලික අධ්‍යයන පැවැත්වීම.
- කර්මාන්තශාලා මට්ටමින් එස් එල් 96 128ප්‍රභේදයේ විවිධ කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම සඳහා ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගමෙහි සීනි කර්මාන්තශාලාවේ විශාල මෝල් පරීක්ෂණයක් පැවැත්වීම.
- උඩවලවේ උක් පර්යේෂණායතනයේ හකුරු නිෂ්පාදන ඒකකය සඳහා භ්‍රමණ අංශක 3ක් සහ VFD වේග පාලන යාන්ත්‍රණයක් සහිත අර්ධ ස්වයංක්‍රීය කැලතීමේ පද්ධතියක් සැලසුම් කිරීම.
- නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට සහ උඩවලවේ උක් පර්යේෂණ ආයතනයේ හකුරු නිෂ්පාදන ඒකකය සඳහා යෝජිත අර්ධ ස්වයංක්‍රීය කැලතීමේ පද්ධතියට ගැලපෙන පරිදි නව හකුරු පැන් නිර්මාණය කිරීම.
- පෙබරවාරි සහ ජූලි මාස පදනම් කරගෙන එස් එල් 96 128 සහ එස් එල් 98 2524 ප්‍රභේදවල පසු අස්වනු පිරිහීම විශ්ලේෂණය කර ඇත.

සේවාවන්

- රුහුණු, ශ්‍රී ජයවර්ධනපුර, වයඹ විශ්වවිද්‍යාලවල සහ ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන් සඳහා උක් සැකසීම සහ අතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- හකුරු නිෂ්පාදකයින් සහ ආයෝජකයින් සඳහා හකුරු නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- බෝග පෝෂණ අංශය මගින් නිපදවන ජෛව පොහොරවල ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණය සිදු කිරීම.
- ක්ෂේත්‍ර පරීක්ෂණවල දී අස්වනු නෙළන ලද උක්වලින් හකුරු කිලෝග්‍රෑම් 1,948ක් නිෂ්පාදනය කිරීම.
- විවිධ හැඩැති හකුරු, විවිධ රසැති හකුරු, උක් යුෂ බීම සහ උක් සිරප් ප්‍රදර්ශන අරමුණ සඳහා නිෂ්පාදනය කිරීම.



ආර්ථික විද්‍යා, පෙවමිනික හා තොරතුරු තාක්ෂණ අංශය

ආර්ථික විද්‍යා පෙළවමිතික සහ තොරතුරු තාක්ෂණ අංශය

කාර්ය මණ්ඩලය

කේ. ඒ. ඩී. කොඩිතුවක්කු මයා (කෘෂි විද්‍යාවේදී, MAGR)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සහ අංශ ප්‍රධානී
බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති)	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
කේ. ජී. එස්. යූ. ආර්. බණ්ඩාර මයා (විද්‍යාවේදී, HNDIT, CCNA)	-	තාක්ෂණික නිලධාරී

ජයග්‍රහණ

පර්යේෂණ

- 2021 වසරේ මිල ගණන් මත උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ යාවත්කාලීන කිරීම. වගා කරන ලද උක් හෙක්ටයාරයකට සාමාන්‍ය පිරිවැය සෙවනගල වාරි පෝෂිත සහ වර්ෂා පෝෂිත අංශ, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ කම්හල් ප්‍රදේශ සඳහා පිළිවෙලින් රු. 411,903, රු. 313,519, රු. 227,809, රු. 290,600 ක් සහ රු.රු.227,086 කි. සෙවනගල උක් හෙක්ටයාරයකින් වසරකට සාමාන්‍ය ශුද්ධ ආදායම රුපියල් 245,034 සහ 149,356 ලෙස පිළිවෙලින් වාරි සහ වර්ෂා පෝෂිත කලාප සඳහා වාර්තා විය. වර්ෂා පෝෂණය යටතේ පැල්වත්තේ සහ වාරි පෝෂණය යටතේ ගල්ඔය ප්‍රදේශයේ ශුද්ධ ආදායම පිළිවෙළින් හෙක්ටයාරයකට රු. 121,503ක් සහ රු.135,449ක් වූ අතර වර්ෂා පෝෂණය යටතේ ඇතිමලේ රු. 108,914ක් වසරකට ශුද්ධ ආදායම් ලෙස වාර්තා විය.
- 2020 වසර සඳහා සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය සීනි කර්මාන්තශාලාවල උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු. 21,156, රු. 19,184 සහ රු. 23,330 ලෙස වාර්තා විය. ඒ අනුව, වාරි අංශයේ සෙවනගල, වර්ෂා පෝෂිත අංශයේ පැල්වත්ත සහ ගල්ඔය 2020 වර්ෂයේ දී ඉඩම් හෙක්ටයාරයකින් නිෂ්පාදනය කරන ලද උක්වල වාණිජ වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 2.3, මිලියන 1.05 සහ මිලියන 1.6ක් වූ අතර, එය එම ප්‍රදේශයේ තරහකාරී බෝගවල ආදායමට වඩා බෙහෙවින් වැඩි විය.
- 2021 වර්ෂය තුළ සීනි ආනයන ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් ටොන් 552,000ක් හා රු. බිලියන 51.4 ලෙස ඇස්තමේන්තු ගත කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සීනි ආනයන ප්‍රමාණයට සහ දේශීය වෙළෙඳපොළේ සීනි සිල්ලර මිලට බලපාන සාධක විශ්ලේෂණය කරන ලදී. මූර්ත සීනි ආනයන බද්ද සහ දේශීය සීනි නිෂ්පාදන ප්‍රමාණය සීනි ආනයන ප්‍රමාණයට සහ ගෝලීය වෙළෙඳපොළේ සීනි මිල, විනිමය අනුපාතය සහ මූර්ත ආනයන බද්ද සැලකිය යුතු ලෙස දේශීය වෙළෙඳපොළේ මූර්ත සීනි මිලටද බලපාන බව සොයා ගන්නා ලදී.
- උඩවලවේ පර්යේෂණ ගොවිපලේ ඉන්දියානු සහ නෙදර්ලන්ත ෆෙරමෝන යොදා ගනිමින් පළිබෝධ කෘමීන් එකතු කිරීම සඳහා ඩෙල්ටා උගුලක් සවිකිරීමේ පිරිවැය පිළිවෙළින් රු. 117,360/ha සහ රු. 44,400/ha ලෙස ඇස්තමේන්තු ගත කරන ලදී.

සේවාවන්

- උක් පර්යේෂණ ආයතනය සත්කාරකත්වය සපයන *www.sugarres.lk* වෙබ් අඩවිය නැවත සැලසුම් කිරීම සහ අවශ්‍ය පරිදි සහ එය යාවත්කාලීන කිරීම.

- "Sugarcane Sri Lanka" සඟරාවේ 4 වැනි කලාපය පළ කිරීම සඳහා ලිපි එකතු කර නිවැරදි කිරීම් සඳහා සංස්කාරකවරුන් වෙත යැවීම.
- SRI හි අනෙකුත් පර්යේෂණ අංශ සඳහා පහත සඳහන් පෙළවමිතික සේවාවන් සැපයීම:

  I. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ RYT සහ PYT දත්ත විශ්ලේෂණය.
  II. පැල්වත්තේ ස්ථාපිත SL 2007 ශ්‍රේණියේ RYT සඳහා ප්‍රභේද තෝරා ගැනීම.
  III. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ iii අවධියේ, RYT සහ PYT දත්ත, CRM හි පරිණත පරීක්ෂණ දත්ත සහ CP, CN, PT සහ TTD අංශවලින් ලැබුණු දත්ත වගුගත කිරීම.
  IV. හකුරු නිෂ්පාදනය සඳහා 2009 ශ්‍රේණියේ ප්‍රභේද විධිමත් වැඩිදුර පරීක්ෂණයන්ට භාජනය කිරීම.
  V. සංයුක්ත පොහොර අත්හදා බැලීමේ පරීක්ෂණ දත්ත විශ්ලේෂණය.

VI. සියඹලාණ්ඩුව ප්‍රදේශයේ වගා කරන ලද SL 96 128 ප්‍රභේදයේ කර්මාන්තශාලාවේ මුල් ඇඹරුම් යන්ත්‍ර යටතේ ක්‍රියාකාරිත්වය ඇගයීම.

- **අනෙකුත් පර්යේෂණ අංශ විසින් සිදු කරන ලද පහත පර්යේෂණ සැලසුම් කරන ලදී.**

I. CN අංශය විසින් පවත්වන ලද කාබනික-ඛණිජ පොහොර ක්ෂේත්‍ර අත්හදා බැලීම සැලසුම් කර එය සිදු කිරීමට සම්බන්ධ විය.
II. CN අංශය විසින් වර්ෂා පෝෂිත සහ වාරි පෝෂිත තත්ව යටතේ සිදු කරන ලද කාබනික පොහොර අත්හදා බැලීම් සැලසුම් කර ගැලපෙන භූමිය තෝරා ගැනීමට සහ ක්ෂේත්‍රයේ අත්හදා බැලීම් සිදු කිරීම සඳහා සම්බන්ධ විය.
III. විවිධ සීනි කර්මාන්තශාලා ප්‍රදේශවල විදේශීය උක් ප්‍රභේද ඇගයීමට පර්යේෂණ සැලසුම් කරන ලදී.
IV. පසු අස්වනු පිරිහීම අධ්‍යයනයේ දෙවන අත්හදා බැලීම සැලසුම් කරන ලදී - PT.
V. අස්වනු නෙළන යන්ත්‍ර ඇගයීම පිළිබඳ ශිෂ්‍යයෙකු සිදු කරන ව්‍යාපෘතියක් සැලසුම් කරන ලදී - MT.

- **පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම, දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් සහ සහය ලබා දීම**

I. උක් හකුරු නිෂ්පාදනය සඳහා එස් එල් 2007 ශ්‍රේණියේ ප්‍රභේදවල ප්‍රතිසාධන සහ සංවේදී ගුණාංග ඇගයීම.
II. ශ්‍රී ලංකාවේ සීනි ආනයන ප්‍රමාණයට සහ දේශීය වෙළෙඳපොළේ මිලට බලපාන සාධක විශ්ලේෂණය.
III. LSD සඳහා බීජ උක් උණු දිය පිරියම් කිරීම සඳහා හොඳම පූර්ව පොහවන කාලය සහ උෂ්ණත්ව කාල සංයෝජනය තෝරා ගැනීම.
IV. ශ්‍රී ලංකාවේ උක් වගාව සඳහා යුක්ත පොහොරවල යෝග්‍යතාවය ඇගයීම.
V. කළු දුඹුලු රෝග ප්‍රතිරෝධීතාව පිරික්සුම් සඳහා නව සම්මත උක් ප්‍රභේද කට්ටලයක් තෝරා ගැනීම
VI. ආයතනය තුළ තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
VII. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයට 2019 වසර සඳහා SRI හි තොරතුරු දත්ත ගබඩාව සකස්කර දීම.

- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) සිසුන් පස් දෙනෙකු පරිගණක මෘදුකාංග පැකේජ භාවිතය පිළිබඳ මාස හයක කාලයක් පුහුණු කිරීම.



තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය

තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය

කාර්යය මණ්ඩලය

ආචාර්ය. එම්. එස්. පෙරේරා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනගුරු)	-	අංශ ප්‍රධානී සහ ප්‍රධාන පර්යේෂණ නිලධාරී (2021 මැයි 31 දක්වා)
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල මයා (කෘෂි විද්‍යාවේදී), පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ව්‍ය. ක)	-	කාර්ය භාර තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරී (2021 ජුනි 01 සිට)
ආර්. ඒ. පී. ඒ. රණතුංග මයා (කෘෂි ඩිප්ලෝමා)	-	සංවර්ධන නිලධාරී
ඩබ්ලිව්. ජී. එම්. එස්. චේරගොඩ මයා (කෘෂි විද්‍යාවේදී , විද්‍යාපති)	-	සංවර්ධන නිලධාරී
එම්. කේ. පි. සී. ගුණවර්ධන මයා (කෘෂි විද්‍යාවේදී , විද්‍යාපති)	-	සංවර්ධන නිලධාරී
ඒ. පී. කරුණාතිලක මයා (කෘෂි විද්‍යාවේදී)	-	සංවර්ධන නිලධාරී
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් මයා (කෘෂි විද්‍යාවේදී)	-	සංවර්ධන නිලධාරී
බී. පී. ජී. එස්. සඳනායක මයා (කෘෂි ඩිප්ලෝමා)	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී
ජී සෝමවීර මයා	-	කළමනාකරණ සහකාර

විශේෂ ජයග්‍රහණයන්

තාක්ෂණ සම්ප්‍රේෂණ/සංවර්ධන ක්‍රියාකාරකම්

- ගොවීන් සඳහා පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන 22ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 2ක් පවත්වමින් ගොවීන් 195ක් සහ ක්ෂේත්‍ර නිලධාරීන් 135ක් නව උක් තාක්ෂණය පිළිබඳව පුහුණු කිරීම. ගොවීන්ගේ ක්ෂේත්‍රවල නිරීක්ෂණ 56 ක් සිදු කරන ලද අතර ජාතික වැවිළි කළමනාකරණ ආයතනය සහ කෘෂිකාර්මික පාසල්වල සිසුන් 65 දෙනෙකුට උක් වගා තාක්ෂණය සහ ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා දීම.
- උක් පර්යේෂණ ආයතනය විසින් නිර්දේශිත උක් ප්‍රභේදවල සහ උක් සමග අතුරු බෝග වගා කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශන 87ක් ස්ථාපිතකොට පවත්වාගෙන යාම.
- කාබනික උක් වගාව පිළිබඳ උක් පර්යේෂණ ආයතනයේ සංශෝධිත පර්යේෂණ වැඩසටහනට අනුකූලව, පර්යේෂණ ගොවිපොළ, ගල්ඔය සහ ඇතිමලේ සීනි සමාගම්වල කාබනික උක් වගාව පිළිබඳ නිරීක්ෂණ ක්ෂේත්‍ර තුනක් ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබනු අතර, ඒ සම්බන්ධව සීනි සමාගම්වල කෘෂිකාර්මික කාර්ය මණ්ඩලය සහ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2022 දී පැවැත්වීමට සැලසුම් කර ඇත.
- උක් ක්ෂේත්‍රයේ පර්යේෂකයන්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර පණිවිඩ හුවමාරු කිරීම සඳහා SRI TTD eSMS සේවාව අබණ්ඩව පවත්වාගෙන යාම. SRI FB පිටුව හරහා සීනි කර්මාන්තයේ තොරතුරු බෙදාගැනීම අබණ්ඩව කරගෙන යාම සහ SRI වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම. මීට අමතරව, SRI පුවත් හසුනෙහි කලාප දෙකක් සහ 2018 සහ 2019 වසර සඳහා වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීම සහ 2020 සඳහා වාර්තාව සම්පූර්ණ කිරීම.
- දිවයිනේ සාම්ප්‍රදායික නොවන උක් වගා කරන ප්‍රදේශවල "උක් වගා ගම්මාන" පිහිටුවීමට මූලික පියවර ගැනීම. මේ යටතේ, නාගොඩ - ගාල්ල, උඟව පරණගම - බදුල්ල, වැලිඔය - මුලතිව්, සහ රුවන්වැල්ල - කෑගල්ල යන ප්‍රදේශවල උක් සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීමට සැළසුම් කර ඇත. මෙම ව්‍යාපෘති රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ. ඉහත වැඩසටහන්වල සාර්ථකත්වය මත උක් වගාව සහ සැකසීම් කළ හැකි ප්‍රදේශවල උක් වගාව ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

ගොවීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ සිසුන් සඳහා වන පුහුණු වැඩසටහන්/ආදර්ශනවල දී සහ සංවර්ධන වැඩසටහන්වල දී පහත වැඩසටහන් අංශ/විෂය ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් ආවරණය කරන ලදී.

උක් වගා පද්ධති, සැකසුම් සහ අතුරු නිෂ්පාදන භාවිතය සම්බන්ධ පවතින තාක්ෂණයන් ප්‍රවර්ධනය

- නිර්දේශිත උක් ප්‍රභේදවලින් සමන්විත හෙක්ටයාර 4.5ක ආදර්ශන/ගුණන ක්ෂේත්‍රයක් උක් පර්යේෂණ ආයතනීය පර්යේෂණ ගොවිපොළෙහි ස්ථාපිතකොට නඩත්තු කිරීම. මෙහි අස්වැන්න තවදුරටත් ගුණනය සඳහා, ගොවීන්/සීනි කර්මාන්තායතන වෙත ලබා දීමට සැළසුම්කර ඇත.
- නව උක් ප්‍රභේදවලින් සමන්විත ආදර්ශන/ගුණන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම.
    - පැල්වත්ත - 01 (එස්. එල්. 00 95, එස්. එල්. 00 603).
    - ඇතිමලේ - 01 (එස්. එල්. 00 354)

- සියඹලාණ්ඩුව - 02 (එස්. එල්. 00 95, එස්. එල්. 00 603)
- හිඟුරාණ - 03 (එස්. එල්. 00 603, එස්. එල්. 00 354, එස්. එල්. 92 1673)

මේ සම්බන්ධ ආදර්ශන වැඩසටහන් 2022 වසරේ දී සිදු කරනු ඇත.

- ගොවි හමුවීම්/ක්ෂේත්‍ර නිරීක්ෂණ 40 සිදු කිරීම (පැල්වත්ත/මොණරාගල - 10, සියඹලාණ්ඩුව/ඇනිමලේ - 14, හිඟුරාණ - 16)
- ඇනිමලේ, සියඹලාණ්ඩුව, පැල්වත්ත සහ හිඟුරාණ ප්‍රදේශයන්හි ගොවි හමුවීම්/ක්ෂේත්‍ර නිරීක්ෂණ 16ක් සිදු කිරීම.
- SL 98 2524 ප්‍රභේදය සමඟ හිඟුරාන ප්‍රදේශයේ අක්කර එකක ගුණන/ආදර්ශන ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම.
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ට්‍රැක්ටර් ක්‍රියාකරුවන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ ගොවි උපකරණ භාවිතය, ක්‍රියාත්මක කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් පුද්ගලයින් 63 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.



- ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගමේ ට්‍රැක්ටර් ක්‍රියාකරුවන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ ගොවි උපකරණ භාවිතය, ක්‍රියාත්මක කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් පුද්ගලයින් 72 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.
- පැල්වත්ත, ඇනිමලේ, සියඹලාණ්ඩුව සහ හිඟුරාන යන ප්‍රදේශවල තෝරාගත් ගොවීන් 66 දෙනෙකුට උක් සමඟ අතුරු බෝග වගා කිරීමේ ආදර්ශන ස්ථාපනය සඳහා අවශ්‍ය බීජ (මුං ඇට, කව්පි, රටකජු) ලබා දීම. එම උක් වගාවන් යොදා ගනිමින් ගොවි ආදර්ශන වැඩසටහන් 12 ක් පැවැත්වීම (2- පැල්වත්ත, 4 - ඇනිමලේ, 3- හිඟුරාන, සහ 3- සෙවනගල). මෙම වැඩසටහන් සඳහා දළ වශයෙන් ගොවීන් 195 දෙනෙකු සහභාගී විය.

උක් වගා පද්ධති, සැකසුම් සහ අතුරු නිෂ්පාදන භාවිතය සම්බන්ධ නව තාක්ෂණය ප්‍රචර්ධනය

- ගුණනය කිරීම සඳහා SL 00 603 ටොන් 4ක් හා SL 00 354 ටොන් 4ක් ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට බීජ උක් ලබා දීම.
- ගුණනය සහ තවාන් පිහිටුවීම සඳහා බීජ උක් ටොන් 20ක් (SL 00 95 – 5 t, SL 00 603 – 5 t, SL 00 652 – 5t, SL 96 128 – 5 t) ඇනිමලේ වැවිලි (පුද්ගලික) සමාගමට ලබාදීම.
- ගුණනය සහ තවාන් පිහිටුවීම සඳහා, SL 00 354 (ටොන් 2), SL 00 652 (ටොන් 1.5), SL 00 603 (ටොන් 2) ඇනිමලේ වැවිලි සමාගමට ලබාදීම.
- උක් වගාවේ දී කාබනික පොහොරවල බලපෑම පිළිබඳ අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ක්ෂේත්‍රයක් පර්යේෂණ ගොවිපොළෙහි ස්ථාපිත කර නඩත්තු කිරීම. ඒ සමගම, බීජ ලබා ගැනීම සඳහා සන්හෙම්ප් ක්ෂේත්‍ර දෙකක් (1/2 ac, සහ 1.2 ac) ස්ථාපිත කිරීම හා එමගින් සන්හෙම්ප් බීජ කිලෝග්‍රෑම් 200 ක් පමණ නිෂ්පාදනය කිරීම. මෙම බීජ තවදුරටත් ගුණ කිරීම සඳහා ගොවීන්/කර්මාන්තායතන අතර බෙදා හැරීමට නියමිතය.

- උක් වගාවේ දී කාබනික පොහොරවල බලපෑම අධ්‍යයනය සඳහා නිරීක්ෂණ ක්ෂේත්‍රයන් ගල්ඔය වැවිලි සමාගමෙහි සහ ඇතිමලේ වැවිලි සමාගම්වල ක්ෂේත්‍රයන්හි ස්ථාපිත කරන ලද අතර, නඩත්තු කටයුතු එම සමාගම් විසින් සිදු කරනු ලබයි.
- බෝග වැඩිදියුණු කිරීමේ අංශය විසින් පිහිටුවන ලද විදේශීය ප්‍රභේද සහිත ක්ෂේත්‍රයන් පිළිබඳ, නිලධාරීන් සහ ගොවීන් ගේ සහභාගීත්වයෙන් ඇගයීම් වැඩසටහන් 2ක් සෙවනගල ලංකා සීනි සමාගමේ දී පැවැත්වීම. රැස්කරන ලද දත්ත, විශ්ලේෂණය සඳහා ආර්ථික විද්‍යා හා ජෛවමිතික අංශය වෙත ලබා දීම.

සංවර්ධන වැඩසටහන්

ගෘහස්ථ මට්ටමේ සීනි කර්මාන්තය සංවර්ධනය (බදුල්ල දිස්ත්‍රික්කය)

- ගුණනය කිරීම සඳහා SL 00 603 ටොන් 4 ක්, SL 00 354 ටොන් 4 ක් ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට බීජ උක් ලබා දීම.
- හාලිඇල ගොවිජන සේවා මධ්‍යස්ථානය සමඟ එක්ව හාලිඇල කැටවල උක් ගොවි සමිතිය පිහිටුවීමට කටයුතු කිරීම.
- ව්‍යාපෘති යෝජනාව සම්පූර්ණ කර, හාලිඇල, කැටවල දී ගොවීන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.

උක් තවාන් සංවර්ධනය (කන්තලේ)

- ගුණනය කිරීම සඳහා SL 00 603 ටොන් 4 ක්, SL 00 354 ටොන් 4 ක් ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට බීජ උක් ලබා දීම
- කලින් ස්ථාපනය කරන ලද ගුණ කිරීමේ තවාන් 3ක් නඩත්තු යාම.
- SL 98 2524 ප්‍රභේදයේ හෙක්ටයාර් 1.8ක තවානක් ස්ථාපිත කර නඩත්තු කිරීම.
- නව සහ පැරණි ප්‍රභේද සහිත හෙක්ටයාර 10.7ක තවාන් - SL 71 30, SL 98 2524, Co 775, SL 00 95, SL 00 354, SL 00 603, SL 04 624, සහ SL 00 652 නඩත්තු කිරීම.
- ජල සැපයුම් ඇළ (කිලෝමීටර් 0.5) ප්‍රතිසංස්කරණය කිරීම.

උක් තවාන් සංවර්ධනය (සෙවණගල, පැල්වත්ත, ඇතිමලේ සහ හිඟුරාන)

- ගුණනය කිරීම සඳහා SL 00 603 ටොන් 4ක් හා SL 00 354 ටොන් 4ක් ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට බීජ උක් ලෙස ලබා දීම.
- ඇතිමලේ සීනි සමාගමට බීජ උක් ටොන් 20ක් (SL 00 95 – 5 t, SL 00 603 – 5 t, SL 00 652 – 5t, SL 96 128 – 5t) ගුණනය කිරීම සඳහා ලබාදීම.
- තවාන් පිහිටුවීම සඳහා ඇතිමලේ වැවිලි සමාගමට SL 00 354 (ටොන් 2), SL 00 652 (ටොන් 1.5), SL 00 603 (ටොන් 2) සඳහා බීජ උක් ලබාදීම.

තොරතුරු සහ ප්‍රචර්ධන මධ්‍යස්ථානය – කොළඹ

- උක් පර්යේෂණ ආයතනයේ පුවත් හසුන වෙළුම. 10-2 සහ වෙළුම. 10-3 ප්‍රකාශයට පත් කිරීම.
- තොරතුරු නිලධාරි ලෙස පුහුණු සංවර්ධන නිලධාරියෙකු බඳවා ගන්නා ලද අතර, එම නිලධාරිනිය වෙනුවෙන් ඔසක පුහුණු වැඩසටහනක් උඩවලව උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්වීම.
- හකුරු නිෂ්පාදන ඒකකය, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ලැයිස්තුවේ ලියාපදිංචි කිරීමට මූලික කටයුතු සම්පාදනය කිරීම.
- තොරතුරු සහ ප්‍රචර්ධන මධ්‍යස්ථානය හරහා සිය නිෂ්පාදන බෙදා හැරීම සඳහා ව්‍යවසායකයෙකු ලියාපදිංචි කිරීම සඳහා කරන ලද මූලික කටයුතු සිදු කිරීම.
- මධ්‍යස්ථානයෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

විවිධ පාර්ශවකරුවන් විසින් ඉල්ලුම්කරන සහ අනෙකුත් වැඩසටහන්

- උක් පර්යේෂණ ආයතනයේ පුවත් හසුන වෙළුම. 10-2 සහ වෙළුම. 10-3 ප්‍රකාශයට පත් කිරීම.
- 2018, සහ 2019 වසරවල වාර්ෂික වාර්තා මුද්‍රණය කරන ලද අතර, ඒවා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- 2020 වාර්ෂික වාර්තාවෙහි 2020 පිටු සැකසීම සම්පූර්ණ කිරීම.
- ප්‍රාදේශීය ලේකම්වරයාගේ ඉල්ලීම මත ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යෝජනා කරන ලද ගෘහස්ත මට්ටමේ සීනි කර්මාන්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- රිදියගම, NLDB ගොවිපළෙහි අක්කර දෙකක උක් තවානක් පිහිටුවීම සඳහා තාක්ෂණික උපදෙස් සහ අවශ්‍ය බීජ උක් ලබා දෙන ලදී. මෙමගින් ලැබෙන අස්වැන්න සත්ත්ව ආහාර සැකසීමට භාවිතා කිරීමට යෝජිතය.
- රත්නපුර කරපිංව කෘෂි විද්‍යාලයේ සිසුන් 42 දෙනෙකු සඳහා උක් වගාව සහ හකුරු/ සිරප් නිෂ්පාදනය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පැවැත්වීම.

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හදාරන සිසුන් 23 දෙනෙකු සඳහා උක් වගාව සහ සැකසීම පිළිබඳ දෙදින පුහුණු වැඩසටහනක් උඩවලවේ SRI හි පැවැත්වීම.



- SRI වෙබ් අඩවිය සහ Facebook පිටුව යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදුකිරීම.
- සීනි සමාගම්වල කාර්ය මණ්ඩලයට උක් තෘක්ෂණය සහ ආයතනීය තොරතුරු බෙදා හැරීම සඳහා කෙටි පණිවුඩ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යෑම.

ප්‍රකාශන

පෙරේරා, ඒ.එම්.එම්.එස්., අත්තනායක, ඩී.පී.එස්.ටී.ජී. සහ විජේසූරිය, ඒ. (2021). ශ්‍රී ලංකාවෙන් එකතු කරන ලද *Saccharum officinarum* දර්ශ වල ජාන විවිධත්වය. වයඹ විශ්ව විද්‍යාල පර්යේෂණ සම්මේලනය - 2021, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය, කුලියාපිටිය.

ඒ.එල්.ඕ. ද සිල්වා, එච්.ඒ.කේ.එන්.එන්. සේනාරත්න, සහ ඩබ්ලිව්.ඒ.ජේ.එම්.ද කොස්තා, (2021) උක් ශාක පත්‍ර වල වායු හුවමාරුව හා මුල් වර්ධනයට ඉහළ උෂ්ණත්වයේ සහ CO2 හි අන්තර්ක්‍රියාකාරී බලපෑම්වල ජානමය විචලනය. Physiologia Plantarum. 173(4), 2276-2290. http://dx.doi.org/10.1111/ppl.13578

ඒ.එල්.ඕ. ද සිල්වා, ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා සහ ඩී. එල්. බී සූරියගොඩ, (2021) තෝරාගත් උක් ප්‍රවේණි වර්ගවල ජෛව ස්කන්ධ සහ සුක්‍රෝස් සමුච්චය මත ඉහළ උෂ්ණත්වය සහ CO2 බලපෑම්. පිටු 14. 2021 නොවැම්බර් 17 වැනි දින කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 33 වැනි වාර්ෂික සම්මේලනය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය. ශ්‍රී ලංකාව.

එල්.එම්.ජේ.ආර්. විජයවර්ධන, කේ.ඩී.එන්. වීරසිංහ, සහ සී.එම්. නවරත්න, (2021) කුඩා ජල පෝෂකවල ගලායාම මැනීම සඳහා ටිපින් බාල්දි උපාංගය. ජල විද්‍යා සඟරාව, 1-9. https://doi.org/10.1080/02626667.2021.1977307

එල්.එම්.ජේ.ආර්. විජයවර්ධන, කේ.ඩී.එන්. වීරසිංහ සහ සී.එම්. නවරත්න, (2021). දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපන සහ ශ්‍රී ලංකාවේ සෙවනගල උක් වගා කරන ප්‍රදේශවල කෘෂි දේශගුණය කෙරෙහි ඒවායේ ප්‍රතිවිපාක. ශ්‍රී ලංකා කෘෂිකර්ම සහ පරිසර පද්ධති සඟරාව, 3(1).

ජයසේකර, එස්. කේ., මධුසංක, ටී.ජී.වයි., රූපසිංහ, සී.පී., වීරසිංහ, එච්.එස්., අබේසේකර, සී.එල්., සෙනවීර, එස්., රත්නායක, ආර්.ආර්., (2021) උක් කර්මාන්තශාලා අතුරුඵල අනුසාරයෙන් ජෛව එතනෝල් නිෂ්පාදනය සඳහා ඇති විභවතාවය, පර්යේෂණ සඟරාව, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම, වෙළුම 49 (2): 169-182

කුලසේකර, බී. ආර්, වීරසිංහ, එච්.ඒ.එස්., සහ ආරියවංශ, බී.ඩී.එස්.කේ., (2021) උක් කර්මාන්ත අතුරුඵල භාවිතයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ මූලික අධ්‍යනය තාක්ෂණය හා අගය එකතු කිරීමේ පර්යේෂණ සඟරාව, උඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය- වෙළුම 3 (1), 76-89.

කුලසේකර, බී.ආර්., සහ වීරසිංහ, එච්.ඒ.එස්., (2021) එස් එල් - 83 06 සහ එස් එල් - 96 128 උක් වගා ප්‍රභේදයන්හි ආරම්භක වර්ධනයට හා පාංශු රසායනික ලක්ෂණ සඳහා උක් කර්මාන්තශාලා අතුරුඵල භාවිතයේ ඇති බලපෑමේ මූලික අධ්‍යනය - යුරෝපියානු පාංශු සංගමය, ජිනීවා, මාර්ගගත සම්මන්ත්‍රණය.

වීරසිංහ, එච්.ඒ.එස්., ගුණරත්න, ජී.පී., ජයකොඩි, ඒ.එන්., සහ ධර්මකීර්ති , ආර්. එස්., (2021) ශ්‍රී ලංකාවේ සෙවනගල වාණිජ උක් වගා භූමියන්හි ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය තත්වය - පර්යේෂණ වාර්තා සටහන, කෘෂිකර්මය සඳහා වූ පශ්චාත් උපාධි ආයතනය වාර්ෂික සම්මන්ත්‍රණය - නොවැම්බර් මස 16 හා 17, 2021, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

කේ. එම්. පී. වංචලා, කේ. එස්. හේමචන්ද්‍ර, එල්. නුග ලියැද්ද, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ සහ ඩබ්. ආර්. ජී. විතාරම (2021) උක් සුදු පත්‍ර රෝග වාහක ඩෙල්ටොසෙෆලස් මෙනොනි (හෙමිප්ටෙරා : සිකඩෙලිඩිඒ), සඳහා සැකරුම් දෙමුහුම්වල පාන්‍රී අවධිය අධ්‍යයනය - නිවර්තන කෘෂිකර්ම පර්යේෂණ , 33(1), පිටු අංක 49-56.

කේ. එම්. පී. වංචලා, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, බී. ආර්. කුලසේකර, කේ. එස්. හේමචන්ද්‍ර, එල්. නුග ලියැද්ද සහ ඩබ්. ආර්. ජී. විතාරම (2021) උක් සුදු පත්‍ර රෝග පයිටොප්ලාස්මා (WLDP) ඩෙල්ටොසෙෆලස් මෙනොනි (හෝමෝප්ටෙරා : සිකඩෙලිඩිඒ) සහ උක් ශාකයේ රෝගවල ද්විතියික සම්ප්‍රේෂණය අතර ත්‍රෛ-පෝෂී සම්බන්ධතාවය අධ්‍යයනය - කෘෂිකර්ම විද්‍යා සංග්‍රහය ශ්‍රී ලංකාව , 16(3).

වයි. ඒ. පී. කේ. දයාසේන , පී. පාන්ඩි, ඒ. එන්. ඩබ්. එස්. කුෂාරි සහ ජී. පී. රාඹ (2021) ශ්‍රී ලංකාව තුල උක් වගාවේ සුදු පත්‍ර රෝගයේ භූගෝලීය ව්‍යාප්තිය සහ පයිටොප්ලාස්මා විශේෂ හඳුනාගැනීම : සුගර් ටෙක්.

ඒ. එන්. ඩබ්. එස්. කුෂාරි, ඒ. විජේසූරිය, බී. ඩබ්. විජේසූරිය, ඒ. එම්. එම්.එ ස්. පෙරේරා සහ ඩී. එම්. කොස්තා (2021) කළු දුඹුළු රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද අභිජනනය සඳහා ශ්‍රී ලංකාවේ උක් ජානප්ලාස්මය හඳුනා ගැනීම (ස්පොරසෝරියම් සසිටමිහේයම්) - සුගර්ටෙක්, 23(5) : 025 – 1036.

පිශ්‍රීමාලි .ඊ් .එන් .යූ ., ඩිමානම්ගොඩ .එස් ., බිබස්නායක .එස් .වී .එම් ., ඒ(2021) සලිම් .කුෂාරි සහ එන් .එම් .ඩබ් .එන් ., පොකාබෝන් හා සම්බන්ධ ෆියුසාරියම් විශේෂවල ව්‍යාධිජනකතාවය සහ අණුක ලක්ෂණ හඳුනා ගැනීම ශ්‍රී ලංකාවේ උක් : .සුගර්ටෙක් - වගාවන්වල මතුවෙමින් පවතින රෝගයක්

ඒ. එන්. ඩබ්. එස්. තුෂාරි, ඩී. එම්. කොස්තා (2021) . දිලීරනාශක ට්‍රයිසෝල් සහ සංස්ලේෂිත එලිසිටර් හාවිතයෙන් උක් කළු දුඹුළු රෝගී තත්වයන් පාලනය කෘෂිකර්ම පස්චාත් උපාධි ආයතනයේ 33 වන වාර්ෂික සහා සම්මන්ත්‍රණය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය , පිටුව 20.

ඒ. එන්. ඩබ්. එස්. තුෂාරි, ඒ. විජේසූරිය, බී. ඩබ්. විජේසූරිය, ඩී. එම්. කොස්තා (2021) උක් වගාවේ කළු දුඹුළු රෝගයට ප්‍රතිරෝධී සැකරම් ඔෆිසිනේරම් එල් සහ ශ්‍රී ලංකාවේ ලබාගත හැකි වල් උක් විශේෂ ඇගයීම. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අන්තර්ජාතික පර්යේෂණ සභාව සම්මන්ත්‍රණය 2021 ශ්‍රී ලංකාව, වෙළුම 23, පිටු අංක 522.

කේ. එම්. ජී. වංචලා, වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ, කේ. එස්. හේමචන්ද්‍ර, එල්. නුග ලියැද්ද සහ ඩබ්. ආර්. ජී. විතාරම (2021) උක් සුදු පත්‍ර රෝග වාහක ඩෙල්ටොසෙෆලස් මෙනොනි (හෙමිප්ටෙරා: සිනඩෙලි ඩීඑ) සඳහා සැකරුම් දෙමුහුම්වල පාත්‍රී අවධිය අධ්‍යනය - පාලනය කෘෂිකර්ම පස්චාත් උපාධි ආයතනයේ 33 වන වාර්ෂික සහා සම්මන්ත්‍රණය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය , පිටුව 32.

සෙව්වන්දි, එම්.ජී.ජී.එන්., ආරියවංශ, බී.ඩී.එස්.කේ, කුමාර, බී.එස්. සහ, මාරලන්ද, ඒ. (2021). ශ්‍රී ලංකාවේ සීනි කම්හල්වල කාර්යක්ෂම යුෂ පැහැදිලි කිරීමේ ක්‍රියාවලිය සඳහා හුණු දියර එකතු කිරීමේ PH අගය ප්‍රශස්ත කිරීම. ඉංජිනේරු ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණ ජාත්‍යන්තර සහරාව, වෙළුම.6, නිකුත් කිරීම 1, අයිඑස්එස්එන් අංක. 2455-2143, පිටු 14-20.

අබේරත්න, කේ.එච්.ඩී., ආරියවංශ. ටී., අල්විස්, පී.එල්.ඒ.ජී. සහ හෙට්ටිආරච්චි, එන්.කේ. (2021). උක් පොහොර යෙදීම් සඳහා රෝද දෙකේ ට්‍රැක්ටරයක් මගින් සෘජුව ධාවනය වන පේලි දෙකේ මිනුම් යාන්ත්‍රණයක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ පරීක්ෂා කිරීම. රජරට විශ්වවිද්‍යාල සහරාව, 6(1).

අබේරත්න, කේ.එච්.ඩී., අල්විස්, පී.එල්.ඒ.ජී. සහ හෙට්ටිආරච්චි, එන්.කේ. (2021). රෝද දෙකේ ට්‍රැක්ටරයට සවිකර ඇති පොහොර යෙදීමේ යන්ත්‍රයේ විවල්‍ය පොහොර යෙදුම් අනුපාතිකයන්ගේ ක්‍රියාකාරීත්වය ඇගයීම. කෘෂි තාක්ෂණය සහ ග්‍රාමීය විද්‍යාව පිළිබඳ 2 වැනි ජාතික සම්මන්ත්‍රණය (NSATRS), 2021 ජුනි 28, කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, වැලිගත්ත, හම්බන්තොට, ශ්‍රී ලංකාව.

ආරියවංශ, ටී., කහදගේ, පී.ඩී. පියතිස්ස,එස්.ඩී.එස්., කොමතෝ, එච්., අහමඩ්, ටී. සහ නොගුචි, ආර්. (2020). “ශ්‍රී ලංකාවේ උක් වගාව සහ සැපයුම් පද්ධතිය අධීක්ෂණය සහ විශ්ලේෂණය සඳහා කාල ශ්‍රේණියේ දත්ත කළමනාකරණ පද්ධතියක් ඒකාබද්ධ කරමින් රාමුවක් සැකසීම”, ජපාන කෘෂිකර්ම තොරතුරුවිද්‍යා සංගමයේ සමුළුව, ටෝකියෝ විශ්වවිද්‍යාලය, ටෝකියෝ, ජපානය.

සම්මාන

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන ලද “PGIA essence” සහරාවට සහරා ලිපිය ලිවීමේ තරගයේ දෙවැනි අනුශූරතාව ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ALC ද සිල්වා මහතාට හිමි විය.

පාලන හා මුදල් අංශය

පාලන හා ගිණුම් අංශය

කාර්ය මණ්ඩලය

ආචාර්ය එම්. එස්. පෙරේරා (කෘෂි විද්‍යාවේදී, දර්ශනපති, දර්ශනශූරී)	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2021.09.01දින සිට)
ඒ. එන්. පී. පෙරේරා මිය (විද්‍යාපති, එම්බීඒ, බීබීඒ,සිමා, ඩිප්.එම්ඒ, එම්අයිපීඑම්, සීබීඒ)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

පාලන අංශය

පී. කේ. එන්. ප්‍රියදර්ශන මයා (විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන(විශේෂ), සීබීඒ)	-	සහකාර අධ්‍යක්ෂ (පාලන)
ආචාර්ය සී. එපිටවල (දර්ශනශූරී)	-	පරිපාලන නිලධාරී
කේ. ආර්. එන්. නන්දසේන මයා	-	සංවර්ධන නිලධාරී
ජේ. කේ. එච්. ජයසේකර මිය	-	සංවර්ධන නිලධාරී
ටී. එම්. කේ. සේනාධීර මිය	-	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර(ලිපිකරු සහ යතුරුලියනය)
එම්. එම්. අයි. එම්. කේ. මැණික්කඩවර මෙනවිය	-	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
එම්. ඒ. ආර්. සමරසේකර මෙනවිය	-	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඕ. යූ. සුබසිංහ මිය	-	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඩබ්ලිව්. ඒ. සමීර. මධුශංක මයා	-	කළමනාකරණ සහකාර (ලිපිකරු සහ යතුරුලියනය)
ඒ. කේ. රත්නායක මිය	-	දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරිනි
ජේ. පී. එස්. පී. කරුණානිලක මයා	-	රියදුරු
ටී. පී. කේ. ජයරත්න මයා	-	රියදුරු
එච්. එස්. ඒ. සුසන්ත කුමාර මයා	-	රියදුරු
ජී. ඩබ්ලිව්. එම්. පී. එස්. මානවඩු මයා	-	රියදුරු
ඒ. එම්. විජේරත්න බණ්ඩා මයා	-	රියදුරු
ඩබ්ලිව්. එම්. ඒ. කේ. ප්‍රියශාන්ත මයා	-	රියදුරු
කේ. ඩී. මංජුල අබේසිරි මයා	-	රියදුරු
එච්. එම්. ඒ. එස්. කේ. හේරත් මයා	-	රියදුරු

නඩත්තු ඒකකය

ජී. එස්. කේ. දහනායක මයා (විද්‍යාවේදී)	-	වැඩ අධිකාරී
ඩී. එච්. එස්. විජේසිංහ මිය	-	වැඩ පරීක්ෂක
ජී. ගමගේ මයා	-	විදුලි කාර්මික
ඩී. ඩබ්ලිව්. එස්. චින්තන මයා	-	වඩු කාර්මික
ආර්. පී. කුලතුංග මයා	-	වඩු කාර්මික
එච්. පී. වන්ද්‍රවංශ මයා	-	ජල පොම්ප ක්‍රියාකරු
කේ. එච්. වීරරත්න මයා	-	ජල පොම්ප ක්‍රියාකරු

ගිණුම් අංශය

ඩී. එම්. ජේ. එන්. දිසානායක මිය (වාණිජවේදී, විද්‍යාපති)	-	ගණකාධිකාරී
අයි. බී. කෝදාගොඩ මයා (වාණිජවේදී)	-	ගිණුම් නිලධාරී
ඩබ්. සී. ජේ. වනිගරත්න මයා	-	සංවර්ධන නිලධාරී
ජී. එම්. එස්. නන්දදේව මයා	-	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්)
ඒ. කේ. අමරකෝන් මිය	-	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්)
ටී. එස්. වීරසිංහ මිය	-	කළමනාකරණ සහකාර (ගිණුම්)

ප්‍රසම්පාදන ඒකකය

ඒ. ජී. යූ. එස්. ද සිල්වා මයා (ගණකාධිකරණ ඩිප්ලෝමා)	-	ප්‍රසම්පාදන නිලධාරී (2021.02.01 දින සිට)
බී. බී. ඒ. ආර්. බෙරුවල මයා	-	සංවර්ධන නිලධාරී
ටී. රංජිත් පීරිස් මයා	-	කළමනාකරණ සහකාර (ගිණුම්)

ගබඩාව

ආර්. ජී. එස්. නිරෝෂණ මයා	-	ගබඩා භාරකරු

අභ්‍යන්තර විගණන ඒකකය

අයි. ජේ. පරණගමගේ මයා (ගණකාධිකරණ ඩිප්ලෝමා)	-	අභ්‍යන්තර විගණක (2021.02.01සිට)
ඩී. එම්. පී. නික්සන් මයා	-	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර (ගිණුම්)

2021වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය

- පුරප්පාඩු පිරවීම; අභ්‍යන්තර විගණක, ප්‍රසම්පාදන නිලධාරී
- අයවැය, වාර්ෂික ගිණුම් සහ ප්‍රගති වාර්තා සකස් කිරීම.
- ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල අවශ්‍යතා අනුව එදිනෙදා පරිපාලනය, පිරිස් කළමනාකරණය,නඩත්තු හා සුබසාධන කටයුතු සහ කාර්ය මණ්ඩල පුහුණුව සිදු කිරීම.

කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සහ අභිප්‍රේරණය

2021වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැටුම

බඳවා ගැනීම්

ආචාර්ය එම්. එස්. පෙරේරා	-	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී	2021.09.01
අයි ජේ පරණගමගේ මයා	-	අභ්‍යන්තර විගණක	2021.02.01
ඒ ජී යූ එස් ද සිල්වා මයා	-	ප්‍රසම්පාදන නිලධාරී	2021.02.01

විශ්‍රාම ගැනීම්

ජී ඩී සුමනදාස මයා	-	පොදු කම්කරු	2021.01.10
එස් එල් පීරිස් මයා	-	රියදුරු	2021.01.08
කේ එම් පද්මාවති මිය	-	පොදු කම්කරු	2021.02.09
එච් ඒ යූ එස් ප්‍රේමරත්න මයා	-	රියදුරු	2021.02.04
සුනිල් සෙල්ලහේවා මයා	-	කම්කරු	2021.03.19
ඩබ්ලිව් නන්දිසේන මයා	-	කම්කරු	2021.04.12
කේ හේමචන්ද්‍ර මයා	-	පොදු කම්කරු	2021.04.21
ටී එම් ඩී ජයතිලක මිය	-	කළමනාකරණ සහකාර(ලිපිකරු සහ යතුරුලියනය)	08.09.2021
කේ හෙට්ටිආරච්චි මයා	-	පොදු කම්කරු	2021.09.13
පී ජයරත්න මයා	-	පොදු කම්කරු	2021.10.15
ඩබ්ලිව් සිරිසේන මයා	-	කම්කරු	2021.11.04

ඉල්ලා අස්වීම්

ඒ ජේ එම් සී එම් සිරිවර්ධන මයා	-	පර්යේෂණ නිලධාරී	2021.05.01

තනතුර අතහැර යාම්

කේ එම් අරුණ වමින්ද මයා	-	කම්කරු	2021.04.20

මියයාම්

එස් රුවන්පතිරණ මයා	-	පොදු කම්කරු	2021.02.01

කාර්ය මණ්ඩල පුහුණුව

සහභාගී වූ පුහුණු වැඩසටහන්/වැඩමුළු/සම්මන්ත්‍රණ (දේශීය)

1) ඒ. එන්. පී. පෙරේරා මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන)) 2021.01.02දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් පවත්වන ලද ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනේ මාර්ගගත වැඩමුළුවකට සහභාගී වූවාය.

2) ඩබ්ලිව්. ඒ. එස්. මධුශංක මහතා (කළමනාකරණ සහකාර) 2021.01.05දින ජාතික වැවිලි කළමනාකාරීත්ව ආයතනය විසින් පවත්වන ලද කාර්යාල පද්ධති සහ කාර්යක්ෂමතා සංවර්ධන පුහුණු වැඩසටහනකට මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගී විය.

3) එච්. ඒ. එස්. වීරසිංහ මහතා (පර්යේෂණ නිලධාරී), බී. ආර්. කුලසේකර මහතා (පර්යේෂණ නිලධාරී), යූ. ඩබ්. එල්. එම්. කුමාරසිරි මහතා (පර්යේෂණ නිලධාරී) සහ ඒ. පී. කරුණාතිලක මහතා (සංවර්ධන නිලධාරී) සහ එම්. ඒ. එන්. බී. ආර් ප්‍රභාත් මහතා (සංවර්ධන නිලධාරී) 2021.01.27 දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් පවත්වන ලද වැවිලි කර්මාන්තයේ ව්‍යවහාරික පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳ වැඩමුළුවට මාර්ගගත ක්‍රමය හරහා සහභාගී වූහ.

4) එම්. ජී. ජී. එන්. සෙව්වන්දි මිය (පර්යේෂණ නිලධාරී) විසින් 2021.03.07 දින සංඛ්‍යා හා කළමනාකරණ ආයතනය (Institute of Mathematics and Management) මඟින් පවත්වන ලද ව්‍යවහාරික සංඛ්‍යාලේඛන සහ පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාවකට සහභාගී විය.

5) ඩී. එම්. ජේ. එන්. දිසානායක මිය (ගණකාධිකාරී), බී. ඩී. එස්. කේ. ආරියවංශ මිය (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී), අයි. බී. කෝදාගොඩ මහතා (ගිණුම් නිලධාරී), ඩබ්ලිව් සී ජේ වනිගරත්න මහතා (සංවර්ධන නිලධාරී) සහ එච් පී වයි සමන්ති මෙනවිය (සංවර්ධන නිලධාරී) 2021.11.24 දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් පවත්වන ලද ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන සහ ගිණුම් පද්ධති (මූල්‍ය රෙගුලාසි සම්බන්ධව) පිළිබඳව මාර්ගගත ක්‍රමය මඟින් පවත්වන ලද පුහුණු වැඩමුළුවකට සහභාගී විය.

6) ඒ. එල්. සී. ද. සිල්වා මහතා (වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා තාක්ෂණ හුවමාරු), ඒ. එන්. පී. පෙරේරා මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ - පාලන), බී. ඩී .එස්. කේ .ආරියවංශ මිය (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී), ඩී. එම්. ජේ. එන්. දිසානායක (ගණකාධිකාරී) සහ එච්. ඒ. එස්. වීරසිංහ මහතා (පර්යේෂණ නිලධාරී) 2021.11.02, 2022.11.09 සහ 2022.12.14 දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මඟින් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද තාක්ෂණික ඇගැයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු මඟින් ඇතිවන දුර්වලතා සහ ප්‍රමාදයන් අවම කිරීම පිළිබඳ වැඩමුළුවකට සහභාගී වූහ.

7) වාණිජ අමාත්‍යාංශය විසින් අනුග්‍රහය දක්වන ලද, මහජන චීන සමූහාණ්ඩුවේ බීජිං හි කෘෂිකර්ම හා ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශයේ විදේශ ආර්ථික සහයෝගිතා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද "the Belt and Road රටවල් සඳහා කෘෂිකාර්මික තාක්ෂණ නවෝත්පාදනය සහ කළමනාකරණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය සඳහා බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ALC ද සිල්වා මහතා සහ යාන්ත්‍රික තාක්ෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ආචාර්ය කේ. ටී. ආරියවංශ මහතා 2021 නොවැම්බර් 10 සිට 23 දක්වා සහභාගී විය.

8) බෝග පෝෂණය අංශයේ පර්යේෂණ නිලධාරී බී. ආර්. කුලසේකර මහතා ඇමරිකා එක්සත් ජනපදයේ Cornell විශ්ව විද්‍යාලයේ සිද්ධි අධ්‍යයනය සමඟ උසස් පාංශු සෞඛ්‍යය පිළිබඳ මාර්ගගත කෙටි පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්වයක් ලැබී ඒ සඳහා සහභාගී වීම.

දිගු කාලීන පුහුණුවීම් (විදේශීය)

කේ. ටී. ආරියවංශ මහතා (පර්යේෂණ නිලධාරී) ජපානයේ ෂුකුබා විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කරන ලදි.

දිගු කාලීන පුහුණුව (දේශීය)

1) ඒ. පී. කරුණාතිලක මහතා (සංවර්ධන නිලධාරී) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සංවර්ධන සන්නිවේදනය සහ ව්‍යාප්තිය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
2) එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන මහතා (පර්යේෂණ නිලධාරී) රුහුණු විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
3) ඒ. එන්. ඩබ්. සුමේධා තුෂාරි මිය (පර්යේෂණ නිලධාරී) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අණුක සහ ව්‍යවහාරික ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
4) වී. කේ. ඒ. එස්. එම්. වනසිංහ මිය (පර්යේෂණ නිලධාරී) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාක ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
5) ඩී. එච්. ජේ. එන්. දිසානායක මිය (ගණකාධිකාරී) කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
6) පී. කේ. එන්. ප්‍රියදර්ශන මහතා (සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)) ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.
7) ඩබ්ලිව්. ඒ. එස්. මධුශංක මහතා (කළමනාකරණ සහකාර) විසින් 2021.07.25 දින සිට වරලත් පුද්ගල කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලබන මානව සම්පත් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2021

2021 වර්ෂයේ විගණන කටයුතු අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කර ඇති අතර මෙම වර්ෂය තුළදී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් 04 ක් පවත්වා ඇත. එම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදී ජාතික විගණන කාර්යාලයෙන් විගණන විමසුම් වශයෙන් නිකුත් කර පෙන්වා දී ඇති අඩුපාඩු මෙන්ම අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන විමසුම්, වාර්තා වශයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු ද නැවත ඇති නොවීමට මෙන්ම අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය මහ පෙන්වීම් සහ ආයතනයේ අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීම, කාර්යසාධනය කිරීම හා මහ පෙන්වීම් සිදු කිරීමත්, විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තා පාලක මණ්ඩලය වෙත යොමු කිරීමත්, එහිදී එම කරුණු තව දුරටත් සාකච්ඡා කිරීම තුළින් ආයතනයේ පරිපාලනමය, ගිණුම්කරණමය කටයුතු මෙන්ම අනෙකුත් අංශවල කටයුතු විධිමත් ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම තුලින් ආයතනයේ කටයුතු විධිමත් ලෙස සිදු කිරීමට හැකියාව ලැබී ඇත.

මීට අමතරව ආයතනයේ ස්ථාපිත අභ්‍යන්තර පාලන පද්ධතියට, මූදල් රෙගුලාසි , ආයතන සංග්‍රහය සහ රජය වරින් වර නිකුත් කරන චක්‍ර ලේඛයන්ට අනුව ආයතනයේ කටයුතු පවත්වා ගෙන යාමටත් පාලක මණ්ඩලයට තීන්දු තීරණ ගැනීම සඳහාත් අවශ්‍ය තොරතුරු ලබා දෙමින් ආයතනීය විගණන හා කළමණාකරණ කමිටුවේ කාර්ය අදාළ කාල පරිච්ඡේදය තුළ නොපිරිහෙලා ඉටු කර ඇත.

ඉන්දික පරණගමගේ,
අභ්‍යන්තර විගණක.
2022.12.31.

විගණනය කරන ලද
මූල්‍ය ප්‍රකාශන

උක් පර්යේෂණ ආයතනය
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2021 (රු)	2020 (රු) - (නැවත සකස් කළ)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	1	257,837,467.93	253,479,818.66
ආයෝජන	2	68,065,031.85	69,287,606.38
	-	325,902,499.78	322,767,425.04
ජංගම වත්කම්			
පාරිභෝගික තොගය	-	30,999,884.73	26,186,950.59
ස්ථාවර වත්කම් තොගය	-	4,378,198.14	-
ජීව විද්‍යාත්මක තොගය	-	-	-
ණයවර ලිපි සඳහා අත්තිකාරම්	-	-	-
තොනිමි වැඩ	-	-	-
වෙළඳ හා අනෙකුත් ලැබියයුතු දෑ	3	44,321,244.37	43,908,188.96
කලින් ගෙවීම් සහ වෙනත් තැන්පතු	4	863,975.00	909,505.00
